සැ. යු.- 2016.06.24 දින පළ වූ අංක 1,973 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,974 - 2016 ජූලි මස 01 වැනි සිකුරාදා - 2016.07.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිටුව		පිටුව
තනතුරු ඇබෑර්තු	1120	විභාග, විභාග ප්‍රතිඵල ආදිය	1148

සැ. යු.- ශ්‍රී ලංකා ළමා සංවර්ධන සංගමය (SLACD) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 මැයි මස 13 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ජූලි මස 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ජූලි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

බී. කේ. එස්. රවීන්ද්‍ර,
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)

2016 ජූනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1119- B 81072 — 5,403 (2016/07)
B 1 -

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙළින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුයි. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බුවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කැලි, අඩි-කෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අත් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

තනතුරු - ඇබෑර්තු

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — බදුල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම්කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 අගෝස්තු මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ජුනි මස 13 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

දිස්ත්‍රික්කය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*	*ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර*	*ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය*
බදුල්ල	මහියංගණය	මහියංගණය නගර කොට්ඨාසයේ අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් ධුරය	දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල.

07-105

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — නුවරඑළිය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම්කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 අගෝස්තු මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ජූනි මස 13 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

දිස්ත්‍රික්කය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*	*ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර*	*ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය*
නුවරඑළිය	අඹගමුව	නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හැටන් දික්ඔය උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර් ධුරය	දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය.

07-104

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — නුවරඑළිය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම්කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 අගෝස්තු මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ජූනි මස 13 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

දිස්ත්‍රික්කය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*	*ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර*	*ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය*
නුවරඑළිය	හඟුරන්කෙත	නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත නගරය කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය	දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය.

07-103

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කුරුණෑගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම්කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 අගෝස්තු මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ජූනි මස 13 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

දිස්ත්‍රික්කය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*	*ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර*	*ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය*
කුරුණෑගල	ගිරිබාව	රාජාංගනය වම් ඉවුර කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ වන්නි හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය	දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල.
කුරුණෑගල	කොබෙයිගනේ	බලදෙර කෝරළය කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ දේවමැදි හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය	දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල.

07-102

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — පුත්තලම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම්කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 අගෝස්තු මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ජූනි මස 10 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

දිස්ත්‍රික්කය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*	*ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර*	*ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය*
පුත්තලම	ආණමඩුව	පාඩිතාපත්තුව කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ දෙමළ හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය	දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම.
පුත්තලම	හලාවත	හලාවත නගර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය	දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම.

07-154

ශ්‍රී ලංකා පොලීසිය

පොලිස් කොස්තාපල් රියදුරු තනතුර

ශ්‍රී ලංකා පොලීසියේ ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් ''අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06,'' යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම් කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2016.08.01 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර, ශ්‍රී ලංකා පොලීසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 3,54,480 - 7 x 3,600 - 27 x 4,440 - රු. 4,99,560.00

2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3-2016 හි II වන උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිටය.

තවද මෙම නිලධාරීන් 2013.01.07 වැනි දිනැති පොල්ස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබාදී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

(අ) දුෂ්කර දීමනා සඳහා රු. 2,000

(ආ) සංයුක්ත දීමනා :
(1) උතුරු සහ නැගෙනහිර සේවය සඳහා රු. 10,500
(2) අනෙකුත් ප්‍රදේශවල සේවය සඳහා රු. 8,400

(ඇ) වෙනත් දීමනා -
නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව රු. 250

(ඈ) නොමිලේ ගමන් පහසුකම්

(ඉ) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)

(ඊ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(උ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(ඌ) රාජකාරි සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

(අ) වයස් සීමාව :
ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 19 ට නොඅඩු විය යුතු අතර වයස අවුරුදු 28ට නොවැඩි විය යුතුය.

(ආ) අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සමත් විය යුතුය. වාර දෙකකදී සාමාර්ථය ලබන

අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේදී විෂයයන් 05ක් සමත් විය යුතුය.

සටහන 01.- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂයය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂයය යුගලය එක් විෂයයක් වශයෙන් ද, සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

සටහන 02 .- අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

සටහන 03.- වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) ශාරීරික සුදුසුකම් :

* උස අඩි 05 යි. අඟල් 03 යි. (අවම),
* පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා).

සටහන : විශිෂ්ට ක්‍රීඩා කෞෂල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගිවී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවෙකුගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇත්නම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඈ) වෘත්තීය සුදුසුකම් :
(1) සැහැල්ලු මෝටර් රථ හෝ බර වාහන පැදවීමේ ප්‍රවීනතා සහතිකය ලබා තිබීම.
(2) ඉහත බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් අවුරුදු 01ක මෝටර් රථ පැදවීමේ පලපුරුද්දක් තිබිය යුතුය.

සටහන.- මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ දැනීම, මෝටර් රථ අළුත්වැඩියාව පිළිබඳ පලපුරුද්ද, රිය පැදවීම දිගුකාලීන පලපුරුද්ද සඳහා ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

* රිය පැදවීමේ දක්ෂතාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන ශාරීරික අවයවයන් හැසිරවීමට බාධා ඇති කරන යම්කිසි අංගවිකලත්වයකින් හෝ වෙනත් ශාරීරික ආබාධයකින් පෙලෙන කිසියම් අයදුම්කරුවෙකු වෙතොත් එම අයදුම්කරු සේවයට සුදුසු බවට වෛද්‍ය සහතිකයක් ලබා තිබුණත්, ඔහු නුසුදුස්සෙකු වනු ඇත.

* මූලික සුදුසුකම් තිබෙන අයදුම්කරුවන් වාහන පැදවීම හා නඩත්තු කිරීමේ හැකියාව පිළිබඳ පරීක්ෂා කරනු ලැබේ. එමෙන්ම මාර්ග නීති, රථ වාහන සංඥා ක්‍රම පිළිබඳ අයදුම්කරුවන් ලබා ඇති දැනුමත්, එක් එක් අයදුම්කරුවා පැදවීමට නිපුනත්වය ලබා ඇති වාහනයෙහි යාන්ත්‍රික සිද්ධාන්තයන් පිළිබඳ මූලික දැනුමක් පරීක්ෂා කරනු ලැබේ.

(ඉ) දෘෂ්ඨිය පිළිබඳ අවශ්‍යතාවයන් .— එක් ඇසක දෘෂ්ඨිය 6/12 අඩු නොවිය යුතු ය. දෘෂ්ඨිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ඨිය සාමාන්‍ය විය යුතු ය. යම් අපේක්ෂකයෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඊ) අනෙක් සුදුසුකම් :

* අයදුම්කරු අවිවාහක විය යුතුය. (දික්කසාද වුව ද මේ සඳහා විවාහකයින් ලෙස සැලකේ.)

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

* අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය හෙවත් ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

1. මීටර් 1,000 - මිනිත්තු 03, තත්පර 44.

* යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ.

06. *වෘත්තීය සුදුසුකම්* :

6.1 වෘත්තීයමය පරීක්ෂණය පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂකගේ අධීක්ෂණය යටතේ පොලිස් රියදුරු පාසලේ සහකාර අධ්‍යක්ෂ විසිනි.

6.2 වෘත්තීයමය පරීක්ෂණය සඳහා ලකුණු 100ක් වෙන් කර ඇත. මෙම වෘත්තීයමය පරීක්ෂණය පහත පරිදි සමන්විත වේ.

(අ)	රිය පැදවීමේ ප්‍රවීනතාවය	ලකුණු 50
(ආ)	මාර්ග නීති උපදේශක සංග්‍රහය	ලකුණු 25
(ඇ)	වාහන නඩත්තු කිරීම සහ සුළු අලුත්වැඩියාවන් පිළිබඳ දැනීම	ලකුණු 25

6.3 වෘත්තීයමය පරීක්ෂණය රිය පැදවීමේ ප්‍රවීනත්වය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 50න් අවම වශයෙන් ලකුණු 25ක් හා මාර්ග නීති උපදේශක

සංග්‍රහය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 25න් අවම වශයෙන් ලකුණු 12.5ක් සහ වාහන නඩත්තු කිරීම හා සුලු අලුත්වැඩියාවන් සම්බන්ධ දැනුම සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 25න් අවම වශයෙන් ලකුණු 12.5ක් ද ලබාගෙන වෘත්තීයමය පරීක්ෂණය සඳහා වෙන් කර ඇති මුලු ලකුණු 100න් ලකුණු 50ක් අවම වශයෙන් ලබා ගෙන ඇති අයදුම්කරුවන් වෘත්තීයමය පරීක්ෂණය සමත් වූ ලෙස සලකනු ලැබේ. වෘත්තීයමය පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් වෛද්‍ය පරීක්ෂණයට කැඳවනු ලැබේ.

සටහන.- බඳවා ගනු ලබන පොලිස් කොස්තාපල් රියදුරන් ආධුනික කාලය අවසන් වීමට ප්‍රථම බර වාහන පැදවීමේ ප්‍රවීනතා සහතිකය ලබාගෙන පොලිස් විද්‍යාලය මගින් පවත්වනු ලබන බර වාහන පැදවීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

07. වෛද්‍ය පරීක්ෂණය :
අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය. වෛද්‍ය පරීක්ෂණයට බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් වූ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය, ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. පසුබිම් පරීක්ෂණය :

(අ) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

09. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම :

* රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.

* 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරි තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

* පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

10. පත්වීමේ කොන්දේසි :

* මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

11. සේවා කොන්දේසි :

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝග යක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙලුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙකුම ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන නියමිත පරීක්ෂණ වලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරීන් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් ගැසට් II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතුන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලීසියේ සේවය කළ යුතු වන අතර මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි ආයතන සංග්‍රහයේ 1 වැනි බාණ්ඩයේ V වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.

(උ) ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන් පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතුය.

(ඌ) ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(එ) ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන්, සේවය ස්ථිර කිරීමෙන් පසු ශ්‍රී ලංකා පොලිසියේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

12. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

13. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල ඡායා පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය.) :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික,(තිබේ නම් පමණක්),

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්,

(උ) රියදුරු බලපත්‍රයෙහි ඡායා පිටපතක්.

14. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතු ය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත්, අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කරනු ලැබූ අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

15. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

***සටහන.*— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.**

පූජිත් ජයසුන්දර,
පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 01.

ශ්‍රී ලංකා පොලීසිය

පොලිස් කොස්තාපල් රියදුරු තනතුර

ආදර්ශ අයදුම්පත්‍රය

01. (අ) සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතු ය. :————.

(ආ) නම (මුලකුරු සමග) :————.

(ඇ) අයදුම්කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඇමිණිය යුතු ය.)

03. පියාගේ සම්පූර්ණ නම :————.

04. අයදුම්කරු උපන් ස්ථානය :————.

උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————. පළාත :————.

05. (අ) වර්තමාන ලිපිනය :————.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඇ) ස්ථිර ලිපිනය :————.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඉ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :————.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
(ඊ) දුරකතන අංකය : නිවස :————. ජංගම :————.

06. (අ) ජාතිය :————.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :————.
* අයදුම්කරු :————.
* අයදුම්කරුගේ පියා :————.
* අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.
* අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :————.

07. උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි).

වයස : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කරන දිනට)

අවුරුදු :————. මාස :————. දින :————.

08. උස : අඩි :——. අඟල් :——. පපුව : අඟල් :——.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන්කර සහතිකවල ඡායා පිටපත් ඇමිණිය යුතු ය) :————.

10. (*අ*) රියදුරු බලපත්‍ර අංකය :————.

(*ආ*) රියදුරු බලපත්‍රය ලබාගත් දිනය :————.

(*ඇ*) ප්‍රවීණතාවය ලබා ඇති වාහන පංතිය :————.
(රියදුරු බලපත්‍රයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය.)

11. අතිරේක සුදුසුකම් :————. (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය.)

12. විවාහක/අවිවාහක බව :————.

13. (*අ*) දැනට කරන රැකියාව :————.

(*ආ*) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :————.

14. ඔබට විශේෂ දක්ෂතාවයන් සහ/හෝ සුදුසුකම් තිබේ ද ? :————.

15. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :
(*අ*) ————,
(*ආ*) ————.

16. ඔබ මීට පෙර නිත්‍ය පොලිස් සේවයේ හෝ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සේවය කර තිබේ ද ? :————.

එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න :————.

17. (*අ*) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය :————.

(*ආ*) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :————.

18. (*අ*) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය :————.

(*ආ*) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :————.

19. ඔබ කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :————.

20. ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :————.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක් වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලිසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

21. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අදළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..... මයා/මිය/මෙනවිය ..... දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන සහ නිල මුද්‍රාව.

තනතුර :————.

දිනය :————.

07-241/2

ශ්‍රී ලංකා පොලීසිය

පොලිස් කොස්තාපල් තනතුර

ශ්‍රී ලංකා පොලීසියේ ආධුනික පොලිස් කොස්තාපල් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් ''අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06,'' යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම් කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2016.08.01 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලීසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. වැටුප් ක්‍රමය :

රු. 3,54,480.00 - 7 x 3,600 - 27 x 4,440 - රු. 4,99,560.00

2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3-2016 හි II වන උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිටය.

තවද මෙම නිලධාරීන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබාදී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත. :-

(අ) දුෂ්කර දීමනා රු. 2,000

(ආ) සංයුක්ත දීමනා :
(1) උතුරු සහ නැගෙනහිර සේවය සඳහා රු. 10,500
(2) අනෙකුත් ප්‍රදේශවල සේවය සඳහා රු. 8,400

(ඇ) වෙනත් දීමනා -
නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව රු. 250

(ඈ) නොමිලේ ගමන් පහසුකම්

(ඉ) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුව ද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)

(ඊ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(උ) තමාගේ ක්‍රීඩා කෞශල්‍යය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(ඌ) රාජකාරි සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

04. අවශ්‍ය මූලික සුදුසුකම් :

(අ) වයස් සීමාව :
ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 - 28ත් අතර විය යුතු ය. එසේ වුවද දැනට ශ්‍රී ලංකා පොලිසියේ රාජකාරියේ නියුතු පොලිස් නිලධාරීන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සමත් විය යුතුය. වාර දෙකක දී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේ දී විෂයයන් 05ක් සමත් විය යුතු ය.

සටහන 01.- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂය අංක 41, 44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් වශයෙන් ද, සලකා විභාග යෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

සටහන 02 .- අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

සටහන 03.- වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) ශාරීරික සුදුසුකම් :

* උස අඩි 05 යි. අඟල් 04 යි. (අවම),
* පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා).

සටහන : විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවෙකුගේ ශාරීරික සුදුසුකම් මදක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඈ) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්* .— එක් ඇසක දෘෂ්ටිය 6/12 අඩු නොවිය යුතු ය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතු ය. යම් අපේක්ෂකයෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඊ) අනෙක් සුදුසුකම් :

* අයදුම්කරු අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන් ද මේ සඳහා විවාහකයින් ලෙස සැලකේ.) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කරන නිලධාරීන්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. බඳවා ගැනීමේ ක්‍රමය :

* අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය *හෙවත්* ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

මීටර් 1,000 - මිනිත්තු 03 තත්පර 44.

* යෝග්‍යතා පරීක්ෂණයෙන් හෝ දරාගැනීමේ පරීක්ෂාව සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

* ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,

- වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය කාලය විනාඩි 45යි. වචන 500කට නොඅඩු විය යුතු ය,
- සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය කාලය පැය 01යි.

06. වෛද්‍ය පරීක්ෂණය :
අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය. වෛද්‍ය පරීක්ෂණය බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් වූ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය, ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. පසුබිම් පරීක්ෂාව :

(*අ*) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(*ආ*) බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම :

- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05ක් තුළ ලබා ගත යුතු ය.

- 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරී තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

- පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

09. පත්වීමේ කොන්දේසි :

- මෙම පත්වීම ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

10. සේවා කොන්දේසි :

(*අ*) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(*ආ*) තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(*ඇ*) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙලුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(*ඈ*) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙකුම ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන නියමිත පරීක්ෂණවලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(*ඉ*) පත්කර ගනු ලැබූ නිලධාරීන් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් *පොලිස් ගැසට්* II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතුන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලීසියේ සේවය කළ යුතු වන අතර මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි ආයතන සංග්‍රහයේ 1 වැනි බාණ්ඩයේ V වැනි පරිච්ඡේදයේ වගන්ති 04ට අනුකූල විය යුතු ය.

(උ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන් පොලිස් පුහුණු අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු ය.

(ඌ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පොලිස් පුහුණු අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(එ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, සේවය ස්ථිර කිරීමෙන් පසු ශ්‍රී ලංකා පොලිසියේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල ඡායා පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය.) :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික,(තිබේ නම් පමණක්),

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්,

13. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් යා කළ යුතු ය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත්, අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

සටහන.— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

පූජිත් ජයසුන්දර,
පොලිස්පති.

පොලිස් මූලස්ථානය
කොළඹ 01.

ශ්‍රී ලංකා පොලීසිය

ආධුනික පොලිස් කොස්තාපල් තනතුර

ආදර්ශ අයදුම්පත්‍රය

01. (අ) සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතු ය. :————.

(ආ) නම (මුලකුරු සමග) :————.

(ඇ) අයදුම්කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඇමිණිය යුතු ය.)

03. පියාගේ සම්පූර්ණ නම :————.

04. අයදුම්කරු උපන් ස්ථානය :————.

උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————. පළාත :————.

05. (අ) වර්තමාන ලිපිනය :————.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඇ) ස්ථිර ලිපිනය :————.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඉ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :————.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
(ඊ) දුරකතන අංකය - නිවස :————. ජංගම :————.

06. (අ) ජාතිය :————.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :————.

* අයදුම්කරු :————.
* අයදුම්කරුගේ පියා :————.
* අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.
* අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :————.

07. උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි).

වයස :— (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසාන දිනට)

අවුරුදු :————., මාස :————., දින :————.,

08. උස : අඩි :——., අඟල් :——., පපුව : අඟල් :——.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන්කර සහතිකවල ඡායා පිටපත් ඇමිණිය යුතු ය) :————.

10. අතිරේක සුදුසුකම් :————. (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය.)

11. විවාහක/අවිවාහක බව :————.

12. (අ) දැනට කරන රැකියාව :————.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :————.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් සහ/හෝ සුදුසුකම් තිබේ ද ? :————.

14. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :
(අ) ————,
(ආ) ————.

15. ඔබ මීට පෙර නිත්‍ය පොලිස් සේවයේ හෝ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සේවය කර තිබේ ද ? :————.

එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න :————.

16. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය :————.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :————.

17. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය :————.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :————.

18. ඔබ කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ?

(එසේ නම් විස්තර සඳහන් කරන්න) :————.

19. ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක් වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලිසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

20. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාල නම් පමණි.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..... මයා/මිය/මෙනවිය ..... දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන සහ නිල මුද්‍රාව.

තනතුර :————.

දිනය :————.

07-241/1

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

නීති නිලධාරි (විධායක නිලධාරීන් ගණයේ III ශ්‍රේණියේ) තනතුරක් සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුරේ පවතින එක් පුරප්පාඩුවක් පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්ෂකයාව පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්* :-

(i) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) පළපුරුද්ද :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

(iii) කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(iv) වෙනත් :

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
- අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු යි.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිර ය.
(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. තනතුරට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් ආකාරයට පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හි සඳහන් විධිවිධාන හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට පත්වී වසර 05ක් ඉකුත්වීමට පෙර රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත් බව සනාථ කළ යුතු ය.

(iv) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි විධායක නිලධර ගණයේ (නීති නිලධාරි තනතුරට) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් විධිවිධානයන්ට හා ඊට මතුවට කරනු ලබන්නා වූ සංශෝධන සහ විධිවිධානයන්ට යටත් වේ.

04. *වයස් සීමාව* :

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

05. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රු. 47,615 - 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170- රු. 1,10,895 ක මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2016.02.25 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016හි අංක SL - 1 - 2016 වැටුප් කාණ්ඩය වේ. මෙම වැටුප් පරිමාණය 2020.01.01 දින සිට ක්‍රියාත්මක වේ.)

2016 වසරට නියමිත වැටුප : මූලික වැටුප - රු. 27,871.00
ගැළපුම් දීමනාව - රු. 9,651.00

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

විෂයය		*උපරිම ලකුණු*
01. ***අතිරේක අධ්‍යාපන සුදුසුකම්*** :		
පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය		20
පිළිබඳ උපාධිය		
- පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා	20	
- දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා	15	
- දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා	10	
නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා	15	
නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා	10	

සටහන.-ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය සමත් වුවහොත් පමණක් ලකුණු 10ක් ලබා දිය යුතුයි.

(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ - උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්)

02. *අතිරේක වෘත්තීය සුදුසුකම් :* 15

පිළිගත් ආයතනයක් විසින් පිරිනමන ලද අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ පශ්චාත් උපාධි නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්)

පිළිගත් ආයතනයක් විසින් පිරිනමන ලද අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා
(එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්)

පිළිගත් ආයතනයක් විසින් පිරිනමන ලද අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා
(එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින්)

03. *අතිරේක පළපුරුද්ද :* 30

නීතිඥවරයකු ලෙස රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද -
මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02
එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30ක්
(මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍යවන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර).

(අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයකුගේ හෝ ජනාධිපති නීතිඥවරයකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතු ය.)

04. පරිගණක සාක්ෂරතාව 15
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදරා තිබීම සඳහා 15

රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා 10
- මාස 06 පැය 720 07
- මාස 03 පැය 360 05

05. *ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව :* 15

ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය 15
(අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතු ය).

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා 10
(වසර 01ක් හෝ පැය 1500)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා
-මාස 06/පැය 720 07
-මාස 03/පැය 360 05

06. **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව :** 05

මුළු එකතුව 100

07. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. *අයදුම්පත් ඉදිරිපත් කිරීම* :

(*i*) අයදුම්පත් 2016.07.25 දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
අංක 330, යුනියන් පෙදෙස,
කොළඹ 02.

(*ii*) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 05 දක්වාත් 02 වන පිටුවේ අංක 06 - 08 දක්වාත් ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(*iii*) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "නීති නිලධාරි තනතුර සඳහා අයදුම් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(*iv*) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු/සමාදාන විනිශ්චයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිබලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 47,615කට වැඩි මූලික මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(*v*) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(*vi*) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

- මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එච්. ටී. කමල් පත්මසිරි,
ලේකම්,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
කොළඹ 02.

2016 ජූලි මස 01 වැනි දින.

ආදර්ශ අයදුම් පත්‍රය

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

[ ]

1. 1.1 මුලකුරු සමග නම : Mr./Mrs./Miss ————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්) :————.

02. 2.1 ස්ථිර ලිපිනය :————.

2.2 දුරකථන අංකය :

ස්ථාවර :————. ජංගම :————.

03. 3.1 ජනවර්ගය : [ ]

(සිංහල - 1, දෙමළ - 2, මුස්ලිම් - 4, වෙනත් - 5)

3.2 ස්ත්‍රී/පුරුෂ භාවය

ස්ත්‍රී	
පුරුෂ	

3.3 විවාහක/අවිවාහක බව :

විවාහක		අවිවාහක	

3.4 ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

3.5 උපන් දිනය :
වර්ෂය :————. මාසය :————. දිනය:————.

3.6 2016.07.25 දිනට වයස :
අවුරුදු :————. මාස :————. දින :————.

4. 4.1 අධ්‍යාපන සුදුසුකම් :

(i) උපාධිය බලපැවැත්වෙන දිනය :————.
(ii) විශ්වවිද්‍යාලය/ආයතනය :————.
(iii) උපාධිය :————.

4.2 *වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද*

(i) අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී හෝ අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට ලබා ඇති සාමාර්ථය :————.

(ii) ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයෙකු වශයෙන් ලබා ඇති පළපුරුද්ද : වසර ගණන :————.

5. යම්කිසි සාපරාධී වරදකට උසාවියේ දී චෝදනා ලබා තිබේ ද? එසේ නම් දිනය හා නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සපයන්න. :————.

6. අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පත්‍රයේ සපයා ඇති විස්තර සත්‍ය බව ද නිවැරදි බව ද මම මෙයින් සනාථ කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරාගැනීමට පෙර දැන ගැනීමට ලැබුණහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද, මෙම තනතුරට මා පත් කර ගැනීමෙන් පසුව එම වරද දැන ගැනීමට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බව දනිමි.

_____,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :_____.

07. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

රජයේ විදුහලක විදුහල්පතිවරයකු, සමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 47,615 කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් හෝ සහතික කරනු ලැබ තිබිය යුතු ය.

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන..... (සම්පූර්ණ නම) මහතා/මහත්මිය/මෙනවිය/මා පෞද්ගලිකව හඳුනන බවත් ..... දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ තැබූ බවත් සහතික කරමි.

_____,
(අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන)

දිනය :_____.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :
තනතුර :_____.
ලිපිනය :_____.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතු ය.)

08. ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ..... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත් ..... දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ තැබූ බවත්, සහතික කරමි.

ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම ..... බවත් මම සහතික කරමි. දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදහැරිය හැකිය/නොහැකිය.

_____,
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන)

දිනය :_____.
නම :_____.
තනතුර :_____.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතු ය.)

07-214

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

නීති නිලධාරි (විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩු එකක් පිරවීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් ඉහතකී පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්* :

(i) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම/ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) පළපුරුද්ද :
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

(iii) කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(iv) වෙනත් සුදුසුකම් :
- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා වන සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිර ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. තනතුරට පත්වී වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ආකාරයට I වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවාවට බැඳුනු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදල ප්‍රවීනතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුන නිලධාරීන් විසින් පරිවාස කාලය තුල නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලටද මෙම පත්වීම යටත් වේ.

04. *වයස් සීමාව* :
ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

05. *වැටුප් පරිමාණය* :
මෙම තනතුරට රු. 47,615 - 10 x 1335 - 8 x 1630 - 17 x 2,170- රු. 1,10,895 (SL-1-2016) මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2016.02.25 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016හි විධිවිධාන වලට අනුකූලව උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් හිමි වේ.)

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ. :-

විෂයය	*උපරිම ලකුණු*
01. ***අතිරේක අධ්‍යාපන සුදුසුකම්*** :	**20**
පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය	
- පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා	20
- දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා	15
- දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා	10
නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා	15
නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා	10
සටහන.-ගෞරව සාමාර්ථයක් සමග අවසාන විභාගය සමත් වුවහොත් පමණක් ලකුණු 10 ලබා දිය යුතුයි.	
(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ - උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්)	
02. ***අතිරේක වෘත්තීය සුදුසුකම් :***	**15**
පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්)	
පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්)	
පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින්)	
03. ***අතිරේක පළපුරුද්ද*** :	**30**
නීතිඥවරයකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද - මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02 එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30ක් (මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර).	
(අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයකුගේ හෝ ජනාධිපති නීතිඥවරයකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතු ය.)	
04. **තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම**	**15**
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්ව විද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදරා තිබීම	15
රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා	10
රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා	
- මාස 06/පැය 720	07
- මාස 03/පැය 360	05

විෂයය		*උපරිම ලකුණු*
05. ***භාෂා ප්‍රවීණතාව*** :		**15**
ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය (අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතු ය).	15	
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසර 01ක් හෝ පැය 1500)	10	
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා		
-මාස 06/පැය 720	07	
-මාස 03/පැය 360	05	
06. **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව**		**05**
මුළු ලකුණු		100

07. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය* :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ. :

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. *අයදුම්පත් ඉදිරිපත් කිරීම* :

(i) අයදුම්පත් 2016.07.21 දිනට හෝ එදිනට ප්‍රථම ''ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, අංක 73/1, ගාලු පාර, කොළඹ 03'' යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් *A*4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර, මුල් පිටුව අංක 01 සිට 07 දක්වාත් 02 වන පිටු අංක 08 - 13 දක්වාත්, ඉතිරිය 03 වන පිටුවටත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "නීති නිලධාරි තනතුර සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු/සමාදාන විනිශ්චයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. 22,935 ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩුව පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය.

2016 ජුනි මස 13 වැනි දින,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය.
අංක 73/1, ගාලු පාර,
කොළඹ 03.

ආදර්ශ අයදුම් පත්‍රය

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

නීති නිලධාරි (විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා අයදුම්පත

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

1.0 අයදුම්කරුගේ නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
1.4 ඔබ දැනටමත් රාජ්‍ය සේවයේ නිරත අයෙක්නම්, රාජ්‍ය සේවයට ඇතුළු වූවාට පසුව ඔබේ නම වෙනස් කර තිබේ ද? :————.
එසේ නම් මුල් නම සඳහන් කරන්න. :————.

2.0 ලිපිනය හා දුරකථන අංකය :

2.1 රාජ්‍ය සේවයේ නිරත අයෙක් නම්, දෙපාර්තමේන්තුවේ/අංශයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.2 දෙපාර්තමේන්තුවේ/අංශයේ නම හා ලිපිනය (සිංහලෙන්/දෙමළෙන් :————.
2.3 පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.4 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.5 දුරකථන අංකය :————.
2.6 ජංගම දුරකථන අංකය :————.

3.0 උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

4.0 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට (2016.05.20 දිනට) වයස :

අවු. :————. මාස :————. දින:————.

5.0 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

6.0 ස්ත්‍රී/පුරුෂ භාවය :

ස්ත්‍රී - 1
පුරුෂ - 2
☐

7.0 විවාහක/අවිවාහක/වැන්දඹු ද යන බව :

විවාහක - 1
අවිවාහක - 2
වැන්දඹු - 3
☐

8.0 අධ්‍යාපන සුදුසුකම් :

(*a*) 8.1 නීතිය පිළිබඳව උපාධිය ලබාගත් විශ්වවිද්‍යාලය/ආයතනය :————.
8.2 උපාධියේ නම :————.

8.3 උපාධිය පිරිනැමූ දිනය :————.
8.4 සාමාන්‍ය/විශේෂ :————.
8.5 පන්තිය :————.
8.6 භාෂා මාධ්‍යය :————.

(*b*) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු ලෙස දිවුරුම් දුන් දිනය :————.

9.0 වෘත්තීය සුදුසුකම් :

විභාගය/ ඩිප්ලෝමාව	*වර්ෂය*	*විෂයයන්*	*සාමාර්ථය*	*ආයතනයේ/විශ්වවිද්‍යාලයේ නම*

10.0 පළපුරුද්ද පිළිබඳ විස්තර :

සේවය කළ ආයතනය	*තනතුර*	*සේවා කාලය*

11.0 ඉංග්‍රීසි භාෂාව සඳහා ලබා ඇති ප්‍රවීණතාව :

11.1 උපාධිය :————.
11.2 ඩිප්ලෝමාව :————.
11.3 සහතික පත්‍ර පාඨමාලාව :————.

12.0 තොරතුරු තාක්ෂණය පිළිබඳ ලබා ඇති සුදුසුකම් :-

12.1 උපාධිය :————.
12.2 ඩිප්ලෝමාව :————.
12.3 සහතික පත්‍ර පාඨමාලාව :————.

13.0 වෙනත් අධ්‍යාපනික සුදුසුකම් (පශ්චාත් උපාධි/ඩිප්ලෝමා/වෙනත් භාෂා ප්‍රවීණතා ආදිය) :-

උපාධිය ඩිප්ලෝමාව/ පාඨමාලාව	වර්ෂය	විෂයයන්	සාමාර්ථය	ආයතනයේ/විශ්ව විද්‍යාලයේ නම

14.0 ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී තිබේ ද? :————.

15.0. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ ප්‍රකාශය :

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ නිවැරදි නොවන බව, මා තෝරා ගැනීමට පෙර දැනගතහොත්, අදළ තනතුරට පත්වීමට මා නුසුදුස්සෙකු වීමට යටත් වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව දැනගතහොත්, මා කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මම දනිමි. තව ද සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ගනු ලබන තීරණවලට මම එකඟ වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

16.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ නීති නිලධාරී තනතුර සඳහා අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ....නමැති අය මා පෞද්ගලික වශයෙන් හඳුනන බවත්, 2016 .....මස ..... දින ඔහු/ඇය මා ඉදිරිපිට අත්සන් කළ බවත් මෙයින් ප්‍රකාශ කරමි.

————,
අත්සන සහතික කරන අයගේ අත්සන.

දිනය :————.
ස්ථානය :————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
ලිපිනය :————.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය

(දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සඳහා පමණක් අදළ වේ.)

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ..... තනතුරේ සේවය කරන ..... මහතාගේ/ මහත්මියගේ/මෙනවියගේ වැඩ සහ හැසිරීම සතුටුදයක වන බවත්, ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව.

දිනය :————.

07-187

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 1 පන්තියේ පුරප්පාඩු

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති අධ්‍යාපන විද්‍යාපීඨයන්හි පහත දිනයන්ට පවතින ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 1 පන්තියේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අයදුම්පත් භාරගනු ලැබේ. :

දිනය	*පුරප්පාඩු ගණන*
2014.01.01	3
2014.07.01	2
එකතුව	5

02. මෙම නිවේදනයේ පහතින් දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, 2016 ජූලි මස 29 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි

තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 1 පන්තියේ පුරප්පාඩු " යනුවෙන් සඳහන් කළ යුතුය. සියළුම අයදුම්කරුවන් විසින් අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

3.1 තෝරාගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය සේවයේ පත්වීම් වලට අදාළ සාමාන්‍ය කොන්දේසිවලට සහ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් හා කොන්දේසිවලට සහ ඒවාට අදාළව වරින් වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයටද, මුදල් රෙගුලාසිවලටද, අංක 1589/30 හා 2009.02.20 දිනැති *අති විශේෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති වලටද යටත්ව ශ්‍රී ලංකා ගුරු අධ්‍යපනඥ සේවයේ 1 පන්තියට පත් කරනු ලැබේ.

3.2 නේවාසික පහසුකම් සලසා ඇති විට අධ්‍යාපන විද්‍යාපීඨ සීමාව තුළ පදිංචි විය යුතුය.

3.3 තනතුරු සඳහා තෝරාගනු ලබන අපේක්ෂක අපේක්ෂිකාවන් සේවා අවශ්‍යතාව අනුව කුමන අධ්‍යාපන විද්‍යාපීඨයක වුවද සේවය කිරීමට බැඳී සිටී.

3.4 *මෙම ගැසට් පත්‍රයේ*-1 කොටසේ දක්වා ඇති රාජ්‍ය සේවා තනතුරු සඳහා පත්කිරීම් වලට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

04. සාමාන්‍ය සුදුසුකම් :

4.1 ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවේ 17 වන වගන්තිය අනුව උපාධිය ලබා ඇත්තේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් නොවේ නම් උසස් කිරීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලැබීම පිණිස අ.පො.ස. (සා.පෙ.) හෝ ඒ හා සමාන විභාගයකදී ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ එයට උසස් සහතිකයක් ලබා තිබීම අවශ්‍යතාවයක් වනු ඇත.

05. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

5.1 ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-I ශ්‍රේණියට උසස්වීම ක්‍රියාත්මක වන දින සිට වසර 05ක සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබීම හා

5.2 පිළිගත් විශ්ව විද්‍යාලයකින් අධ්‍යාපනය පිළිබඳ පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ (ඉහළ) උපාධියක් ලබා තිබීම හෝ අධ්‍යාපනය පිළිබඳ ඉහළ උපාධියක් ලබා තිබීම ; හෝ

5.3 පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක් ලබා තිබීම සහ විශිෂ්ට හෝ සම්මාන හෝ සාමාර්ථයක් සහිතව පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදාළ විෂයය ක්ෂේත්‍රයෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම ; හෝ

5.4 පිළිගත් විශ්ව විද්‍යාලයකින් පළමු හෝ දෙවන පන්තියේ (ඉහළ) සාමාර්ථයක් සහිතව උපාධියක් හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදාළ විෂයය ක්ෂේත්‍රයෙන් හෝ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

06. වැටුප් පරිමාණ :

6.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව SL 1-2006 වැටුප් කාණ්ඩය යටතේ වන රු. 22,935-10x645- 8x790-17x1,050-රු. 53,555 (මාසික) වැටුප් පරිමාණය අදාළ වේ.

07. තෝරා ගැනීමේ ක්‍රමය :

7.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් එම කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ලකුණු පටිපාටියකට අනුව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරාගනු ලැබේ.

7.2 සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ පහත සඳහන් ලිපි ලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. :

7.2.1 උප්පැන්න සහතිකය (උපකෘත පාසල් වලට ඇතුළත් කිරීමේ නීතිය යටතේ නිකුත් කර ඇති උප්පැන්න සහතිකය හෝ බෞතීස්ම සහතිකය හෝ පිළිගනු නොලැබේ.)

7.2.2 උපාධි සහතික සහ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ වෙනත් සහතික

7.2.3 වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික

7.2.4 සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා දැනුම පිළිබඳව ලබා ඇති උසස්ම සහතික

7.3 පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් සංඛ්‍යාවක් පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

7.4 එක් එක් පුරප්පාඩුව ඇති වූ දිනට පූර්වාසන්න පස් අවුරුදු සේවා කාලය තුළ විනය දඬුවමකට භාජනය නොවීමෙන් හා වැටුප් වර්ධක උපයා ගැනීමෙන් සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

7.5 සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අවශ්‍ය ලිපිලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයගේ අයදුම්පත් ගැන සළකා බලනු නොලැබේ.

සැ.යු.-කිසිදු සහතිකයක් හෝ පිටපත් අයදුම්පතට ඇමිණිය යුතු නොවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩබ්ලිව්. එම්. බන්දුසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2016 ජූනි මස 10 වැනි දින

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-I ශ්‍රේණියේ නිලධාරීන් 1 පන්තියට උසස් කිරීමේ ලකුණු පරිපාටිය

01. සේවා පළපුරුද්ද — උපරිම ලකුණු 60
(ශ්‍රී ලං.ගු.අ.සේ.2-I ශ්‍රේණියට උසස් වී වසර 5ට වැඩි අමතර සක්‍රීය සේවා කාලය සඳහා එක් වසරකට ලකුණු 12 බැගින් උපරිම වසර 5ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.)

02. අතිරේක අධ්‍යාපන සුදුසුකම් — උපරිම ලකුණු 12
(ශ්‍රී ලං.ගු.අ.සේ. 1 පන්තියට ඉල්ලුම් කිරීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ඇති සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)

2.1 ආචාර්ය උපාධිය (අදාල විෂයය ක්ෂේත්‍රයක) -12
2.2 පශ්චාත් උපාධිය (අදාල විෂයය ක්ෂේත්‍රයක) -10
2.3 පශ්චාත් උපාධි ඩිප්ලෝමා (අධ්‍යාපන හෝ අධ්‍යාපන කළමනාකරණ නොවන) -05

03. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව — උපරිම ලකුණු 06
(1 පන්තියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 4.1 යටතේ සළකා බැලෙන සුදුසුකමට අමතර සුදුසුකම් සඳහා පමණක් ලකුණු හිමිවේ.)

3.1 උපාධියට ඉංග්‍රීසි විෂයක් ලෙස/උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම -06
3.2 අ.පො.ස.(උ.පෙළ) ඉංග්‍රීසි විෂයය සඳහා විශිෂ්ඨ / අධි සම්මාන සාමාර්ථය -05
3.3 අ.පො.ස.(උ.පෙළ) ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමාර්ථය -04
3.4 අ.පො.ස.(උ.පෙළ) ඉංග්‍රීසි විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථය -03
3.5 අ.පො.ස.(සා.පෙළ) ඉංග්‍රීසි විෂයය සඳහා විශිෂ්ඨ / අධි සම්මාන සාමාර්ථය -02
3.6 අ.පො.ස.(සා.පෙළ) ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමාර්ථය -01

04. සන්නිවේදන හැකියාව — උපරිම ලකුණු 02
දෙවන භාෂා සන්නිවේදන හැකියාව

05. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම — උපරිම ලකුණු 05
(විශ්ව විද්‍යාලයකින් හෝ තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයකින් ලබාගත් සහතික සඳහා පමණක් ලකුණු හිමිවේ.)

5.1 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධිය -05
5.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උපාධිය -05
5.3 උපාධිය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයක් ලෙස හදාරා තිබීම -04
5.4 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (අවුරුදු 1ට හෝ ඊට වැඩි) -03
5.5 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (මාස 06ට වැඩි) -02
5.6 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (මාස 06 දක්වා) -01

06. ගුරු අධ්‍යාපනයේ සංවර්ධනයට දායකත්වය — උපරිම ලකුණු 10

6.1 විද්‍යාපීඨ පරිපාලනයට අයත් සමිති සහ කමිටුවල නිලතල දැරීම / ආයතනයේ සංවර්ධනයට අදාළ වැඩසටහන්, ශ්‍රමදාන, උත්සව, ප්‍රදර්ශන වැඩමුළු සඳහා ක්‍රියාකාරී දායකත්වය -02
6.2 විද්‍යාපීඨ සංවර්ධනයට හා අධ්‍යාපනයට අදාළ විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා නව සංකල්ප හඳුන්වාදීම/වාර ප්‍රකාශන හා පර්යේෂණ සඳහා දායකත්වය -02
6.3 විද්‍යාපීඨයේ පෝෂිත පාසල්වල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම -02
6.4 ජාතික අධ්‍යාපන ආයතනය සමඟ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් / විෂයය මාලා සංවර්ධනය සඳහා දායකත්වය -02
6.5 පීඨාධිපති / ගුරු විද්‍යාල විදුහල්පති තනතුරුවල රාජකාරි ආවරණය කිරීම (වසරකට ලකුණු 1/2 බැගින්) -02

07. ශාස්ත්‍රීය කාර්යසාධනය — උපරිම ලකුණු 05

7.1 පර්යේෂණ හා නිබන්ධන (උපාධිය / පශ්චාත් උපාධිය / පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ ආචාර්ය උපාධිය සඳහා ඉදිරිපත් කළ පර්යේෂණ හා නිබන්ධන මේ යටතේ අදාළ නොවේ) -02

7.2 ප්‍රකාශන (අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව) -02

7.3 අධ්‍යාපන ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ආයතන සංග්‍රහයට අනුව විධිමත් ආකෘතියෙන් නිකුත් කරන ලද සේවා ඇගයීම් -03

මුළු ලකුණු 100

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 1 පන්තියේ පුරප්පාඩු

ආදර්ශ අයදුම්පත්‍රය

(A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කර ගත යුතු ය.)

01. (i) මුලකුරු සමග නම (සිංහලෙන්)
:————. (හිමි/මයා/මිය/මෙනවිය)
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
Rev./Mr/Mrs/Miss :————.

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම :————.

02. (i) රාජකාරි ලිපිනය :————.

(ii) පෞද්ගලික ලිපිනය :————.

(iii) පෞද්ගලික දුරකථන අංකය :————.

03. (i) උපන් දිනය :————.

(ii) ජාතික හැඳුනුම්පත් අංකය :————.

04. (i) මුල් පත්වීමේ දිනය හා තනතුර :————.
(ii) වර්තමාන තනතුර හා එයට පත් වූ දිනය තනතුර :————.
(iii) වර්තමාන සේවා ස්ථානය :————.

05. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :

(i) පළමු උපාධිය :

උපාධියේ නම සහ නිකුත්කළ ආයතනය	වර්ෂය	පන්තිය	විෂයයන්

(ii) පශ්චාත් උපාධිය :

සහතිකයේ නම සහ නිකුත්කළ ආයතනය	වර්ෂය	පන්තිය	විශිෂ්ඨ/සම්මාන/ සාමාන්‍ය ද යන වග

(iii) අධ්‍යාපන ඩිප්ලෝමාව :

සහතිකයේ නම සහ නිකුත්කළ ආයතනය	පාඨමාලාවට ගත වූ කාලය	විශිෂ්ඨ/සම්මාන/ සාමාන්‍ය ද යන වග	විෂයයන් පිළිබඳ විස්තර

(iv) වෙනත් වෘත්තීය සුදුසුකම් (ඩිප්ලෝමා සහතික හා පුහුණු ගුරු සහතික පිළිබඳ විස්තර) :

සහතිකයේ නම සහ නිකුත් කළ ආයතනය	පාඨමාලාවට ගත වූ කාලය	විෂයයන් පිළිබඳ විස්තර

(v) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය :

අ.පො.ස. සා/පෙළ	විශිෂ්ඨ ද/සම්මාන ද/ සාමාන්‍ය ද යන වග	ප්‍රතිඵල වලංගු දිනය

ඉංග්‍රීසි විෂයයට අදාළව ලබා ඇති උසස්ම සහතිකය	නිකුත් කළ ආයතනය හා වලංගු දිනය	ශ්‍රේණිය

(vi) පළපුරුද්ද හා සේවා විස්තර (කලින් දරන ලද තනතුරු හා එම තනතුරු දැරූ කාලපරිච්ඡේදයන් දින වකවානු සහිතව සඳහන් කරන්න) :

දෙපාර්තමේන්තුව/ආයතනය	තනතුර	ස්ථිර ද /තාවකාලික ද	සිට	දක්වා

06. (6.1) කිසියම් වරදකට උසාවියක දී ඔබ වරදකරුවෙකු වශයෙන් තීරණය කර තිබේ ද?
(එසේ නම් විස්තර සඳහන් කරන්න)

(6.2) දැනට ඔබට විරුද්ධව දෙපාර්තමේන්තුමය, විනයානුකූල පරීක්ෂණයක් පවත්වන්නේ ද? නැතහොත් අධිකරණය ඉදිරියේ නඩුවක් විභාග වෙමින් පවතී ද? (එසේ නම් විස්තර සඳහන් කරන්න).

(6.3) මෙම ඉල්ලුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති සියළුම තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි දී ඇති තොරතුරු කිසිවක් අසත්‍ය හෝ සාවද්‍ය බව අනාවරණය වුවහොත් ඒ මත මා මෙම තනතුර ලැබීමට නුසුදුස්සකු බවට තීරණය කරන බවත්, උසස්වීම ලැබීමෙන් පසු මෙහි සඳහන් තොරතුරු කිසිවක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව අනාවරණය වුවහොත් මා කිසිම වන්දියක් නොලබා තනතුරින් පහකිරීමට යටත් වන බවත් දනිමි.

_____.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ආයතන ප්‍රධානියාගේ සහතිකය

..... ගේ ඉල්ලුම්පත ඉදිරිපත් කරමි. ඔහු /ඇය මෙම ආයතනයේ ..... වශයෙන් සේවය කරන බව / සේවය කර ..... දින විශ්‍රාම ලබා ඇති බව ද දන්වමි.

_____,
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.
දෙපාර්තමේන්තුව :————.

07-209

විභාග, විභාග ප්‍රතිඵල ආදිය

ආයුර්වේද දෙපාර්තමේන්තුව

ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (I)

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයට අයත් වෛද්‍ය නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් පැවැත්වීමට කටයුතු යොදා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය කොළඹ දී පැවැත්වේ.

1. ආයුර්වේද කොමසාරිස් විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ.

2. ඉල්ලුම්පත්‍ර මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතිවලට අනුකූලව සකස් කර එවිය යුතු ය. එම ආදර්ශ ආකෘතිය අනුව ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථාවට අදාළව සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කළයුතු අතර, එම අයදුම්පත්‍රය අපේක්ෂකයින් විසින් සිය ආයතන ප්‍රධානියා මගින් 2016.07.15 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේඛකාධිකාරී, විභාග අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න, මහරගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (I)" යනුවෙන් සඳහන් විය යුතු ය. අයදුම්පත්‍රය කැඳවන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු වරට මෙම විභාගයට පෙනී සිටීමට කිසිදු ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත්, ඉන්පසු වාරවල දී නිලධාරීන් විසින් එකවර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් රුපියල් 200 ක් වටිනා මුද්දර ද, එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම්, රු. 50 ක් බැගින් වටිනා මුද්දර ද අයදුම්පතෙහි අලවා තම අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතු ය. මොනම කරුණක් යටතේ වුව ද එම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

3. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :
අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී සහ පෙනී සිටින සෑම විෂයයක් පාසාම ආයුර්වේද දෙපාර්තමේන්තුව සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතරින් කුමක් වුවත් භාරගනු ලැබේ.
   (i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය.
   (ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

4. අයදුම්පත් පිළිගන්නා ලද නිලධාරීන් වෙත ආයුර්වේද කොමසාරිස් විසින් විභාග කාලසටහන සහ ප්‍රවේශ පත්‍රය නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් අත්සන නියමිත පරිදි සහතික කරවාගන්නා ලද ප්‍රවේශ පත්‍රය ආයුර්වේද දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. යම්කිසි නිලධාරියෙකුට විභාගය පැවැත්වීමට අඩු වශයෙන් දින හතකට (07) පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත් ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව පහත සඳහන් විස්තර සමඟ "ලේඛකාධිකාරී, විභාග අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න, මහරගම" යන ලිපිනයට වහාම දැන්විය යුතු ය. :-
   (i) විභාගයේ නම :————.
   (ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
   (iii) අයදුම්කරුගේ ලිපිනය :————.
   (iv) අයදුම්පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලයේ නම සහ ලියාපදිංචි කුවිතාන්සියේ අංකය හා දිනය :————.

5. විභාග පරිපාටිය :
(ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයට අයත් සේවා ව්‍යවස්ථාවට අනුකූලව.)

   I. මුදල් රෙගුලාසි.—පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්.
      (i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ i වැනි කාණ්ඩය (10 පරිච්ඡේදය හැර),

   II. ආයතන සංග්‍රහය.—පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්. :
      (i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ පළමුවැනි කාණ්ඩයේ I, II, III, IV, V, VI, VII, VIII, XII, XIII, XIV, XXIII, XXVII, XXIX, XXX, XXXII පරිච්ඡේද සහ, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහය පිළිබඳ දැනුම,
      (ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දෙවැනි කාණ්ඩයේ XLVII සහ XLVIII පරිච්ඡේද.

   III. ආරෝග්‍යශාලා පරිපාලනය.—පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක් :
      (i) ආරෝග්‍යශාලා පිළිබඳ පැවැත්වෙන සාමාන්‍ය නීති රීති,
      (ii) ආරෝග්‍යශාලාව පිරිසිදුව තබා ගැනීම,
      (iii) රෝගීන් සම්බන්ධව බලපැවැත්වෙන නීති රීති,
      (iv) රෝගීන්ට නියමිත ආහාරපාන ලබාගන්නා විධි,
      (v) ඖෂධ නිෂ්පාදනාගාර පාලනය,
      (vi) රෝගීන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් බලපැවැත්වෙන නීතිරීති,
      (vii) ආරෝග්‍යශාලාවල වෛද්‍ය අධිකාරිගේ සිට අනෙකුත් කණිෂ්ඨ සේවකයින් දක්වා ඔවුන්ට අයත් රාජකාරි පිළිබඳව ඇති අවබෝධය,
      (viii) ආරෝග්‍යශාලාවල සාමාන්‍ය පාලන කටයුතු,
      (ix) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පාලන රෙගුලාසි,
      (x) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ගබඩා ගිණුම් පිළිබඳ නීති රීති,
      (xi) ආයුර්වේද කාර්ය සංවිධාන සංග්‍රහය.

IV. රාජ්‍ය භාෂා වාචික පරීක්ෂණය.—සිංහල/දෙමළ (විනාඩි 15)

(i) සිංහල භාෂා මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධරයන් සඳහා;

(අ) දෙමළ භාෂාවෙන් අසන ප්‍රශ්නවලට දෙමළ භාෂාවෙන් පිළිතුරු දීම,

(ආ) දෙමළ භාෂාවෙන් අසන වාක්‍ය සිංහල භාෂාවෙන් ප්‍රකාශ කිරීම,

(ඇ) සිංහල භාෂාවෙන් අසන වාක්‍ය දෙමළ භාෂාවෙන් ප්‍රකාශ කිරීම.

(ii) දෙමළ භාෂා මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධරයන් සඳහා;

(අ) සිංහල භාෂාවෙන් අසන ප්‍රශ්නවලට සිංහල භාෂාවෙන් පිළිතුරු දීම,

(ආ) සිංහල භාෂාවෙන් අසන වාක්‍ය දෙමළ භාෂාවෙන් ප්‍රකාශ කිරීම,

(ඇ) දෙමළ භාෂාවෙන් අසන වාක්‍ය සිංහල භාෂාවෙන් ප්‍රකාශ කිරීම.

විභාගය සමත්වීම සඳහා එක් එක් විෂයයට අවම වශයෙන් ලකුණු 40ක් ලබාගත යුතු ය.

එල්. එච්. තිලකරත්න,
ආයුර්වේද කොමසාරිස්,
ආයුර්වේද දෙපාර්තමේන්තුව.

2016 ජුනි මස 14 වැනි දින,
නාවින්න, මහරගම,
ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (I)

විභාග අංකය : ☐
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි.)

විභාගයට පෙනී සිටින මාධ්‍යය : ☐
(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)
(සිංහල - S , දෙමළ - T)

01. මුලකුරු සමග නම (Mr./Mrs./Miss) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

02. මුලකුරු සමග නම :————. මයා./මිය./මෙනවිය
(සිංහලෙන්/දෙමළෙන්)

03. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

04. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(සිංහලෙන්/දෙමළෙන්)

05. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐

06. (i) සේවා ස්ථානය හා ලිපිනය :
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(ii) සේවා ස්ථානය අයත් පළාත :————.

07. (i) සේවා ස්ථානය හා ලිපිනය :
(සිංහලෙන් හෝ දෙමළෙන්) :——.
(ii) දුරකථන අංකය :————.

08. (i) දැනට දරන තනතුර :————.

(ii) පත්වීම් ලිපියේ අංකය හා දිනය :————.

09. ඔබ දැන් ඉදිරිපත් වන විෂය/විෂයයන් :

අනු. අංකය	විෂයය	විෂයය අංකය

10. ඔබ මින් ඉහත විභාගයක දී පහත සඳහන් විෂයයන් එකකින් හෝ කිහිපයක් හෝ සමත්වී තිබේද? මුදල් රෙගුලාසි/ආයතන සංග්‍රහය/ආරෝග්‍යශාලා පරිපාලනය/වාචික පරීක්ෂණය (දෙමළ/සිංහල)

එසේ නම් විභාග අංකය, වර්ෂය සහ මාසය සඳහන් කරන්න.

විෂයය	විභාග අංකය	වර්ෂය සහ මාසය

11. ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.

විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් අලවන ලද මුද්දරවල වටිනාකම :————.

මුද්දර කොටුව :

සම්පූර්ණ විභාගය සඳහා රු. 200ක් වටිනා මුද්දර ද, එක් එක් විෂයයක් සඳහා නම් රු. 50ක් බැගින් වටිනා මුද්දර ද මෙහි අලවන්න.

සංලක්ෂ්‍යය.—අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නියමිත වටිනාකමින් යුත් මුද්දර ඔහුගේ/ඇයගේ අත්සන සහ දිනය යොදා අවලංගු කළ යුතු යි. මුද්දර එක පිට එක නොඇලවිය යුතු යි.

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. මෙහි අලවා ඇති රු. ..... ක මුද්දර පාවිච්චි නොකරන ලද වලංගු ඒවා බවත්, සහතික කරමි. මෙම විභාගය සඳහා පනවා ඇති නීති රීති පිළිබඳව මම එකඟ වෙමි.

————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

සටහන.—තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

අත්සන සහතික කිරීම

මාගේ කාර්යාලයේ නිලධාරියෙකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ..... මහතා/ මහත්මිය/ මෙනෙවිය .....වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන සහ
නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

07-222

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු තනතුරේ - III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා 2016.07.01 වැනි දිනට වයස අවුරුදු 18ට වැඩි සහ 30ට නොවැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ. අයැදුම්පත් භාරගන්නා අවසාන දිනය 2016.08.01 වේ. සියලුම අයැදුම්පත් එදිනට ප්‍රථම ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කිසිම අයැදුම්පතක් පුද්ගලික නමට එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ නොකළ යුතුය. අසම්පූර්ණ, අවිධිමත්, අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, නිසි පරිදි මුදල් ගෙවා නොමැති සහ ප්‍රමාද වී ලැබෙන අයැදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන් තම අයැදුම්පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් නියමිත දිනට පෙර එවිය යුතුය. මෙම විභාගය පැවැත්වීම සඳහා විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට අපේක්ෂිත නගර හා නගර අංක 1 වැනි උපලේඛනයේ දක්වා ඇත. අයදුම්පත්‍රයේ ඉහළ ශීර්ෂයේ මෙම නගර අංක ලේඛනයට අනුව සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එහෙත් ප්‍රමාණවත් අයැදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම් කර නොමැති නගරවල අයැදුම්කරුවන් ආසන්න වෙනත් නගරයක විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. කෙසේ වුව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම් කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

I වැනි උපලේඛනය

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක

නගරය	නගර අංකය
කොළඹ	01
ගම්පහ	02
කළුතර	03
මහනුවර	04
මාතලේ	05
නුවරඑළිය	06
ගාල්ල	07
මාතර	08
හම්බන්තොට	09
යාපනය	10
මන්නාරම	11
වවුනියාව	12
මුලතිව්	13
කිලිනොච්චිය	14
මඩකලපුව	15
අම්පාර	16
ත්‍රිකුණාමලය	17
කුරුණෑගල	18
පුත්තලම	19
අනුරාධපුරය	20
පොළොන්නරුව	21
බදුල්ල	22
මොණරාගල	23
රත්නපුර	24
කෑගල්ල	25

01. *අයැදුම්පත් කැඳවනු ලබන තනතුර* :

දුම්රිය එන්ජින් රියදුරු III ශ්‍රේණිය

02. *තනතුරේ රාජකාරි ස්වභාවය* :

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ධාවනය කිරීමේ කාර්යයයේදී දුම්රිය එන්ජින් රියදුරුගේ කාර්යය සඳහා විශේෂිත තාක්ෂණික නිපුණතාවයන්, එනම් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා මට්ටම් හය (06) යටතට ගැනෙන්නාවූ අදාල තාක්ෂණික නිපුණතාවයෙන් සමන්විතව දුම්රිය එන්ජිම ක්‍රියා කරවීමේ කාර්ය ඉටු කිරීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන පොදු මූලික අවශ්‍යතාවන් ඉටු කරන සේවා ගණයකි.

03. *වැටුප් පරිමාණය* :

දුම්රිය එන්ජින් රියදුරු - III පෙළ සඳහා අදාළ වන වැටුප් පරිමාණය;
රු. 16,500 - 5 x 240 - 5 x 280 - 10 x 350 - 10 x 360

04. (*අ*) *අධ්‍යාපන සුදුසුකම්* :

(i) භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය සහ විද්‍යාව ඇතුළු විෂයයන් 04කට සම්මාන සාමාර්ථයන් සහිතව අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 06 කින් සමත් වී තිබීම;

සහ

(ii) අ. පො.ස. (උසස් පෙළ) විභාගයෙන් සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ තවත් එක් විද්‍යා විෂයයක් ඇතුළුව සියළු විෂයන්ගෙන් එකවර සමත්ව තිබීම.

(*ආ*) *වෘත්තීය සුදුසුකම්* :

පහත සඳහන් පාඨමාලාවලින් එකක් හෝ රත්මලාන ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනය හෝ රජයේ කාර්මික විද්‍යාලයක හෝ ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය යටතේ ඇති කාර්මික විද්‍යාලයක හෝ දැවුරුදු පූර්ණකාලීන ඩීසල් එන්ජින් පිළිබඳ පාඨමාලාවක් හදරා සහතිකය ලබා තිබීම. මෙම පාඨමාලාව ජාතික වෘත්තීය කුසලතා හය (06) මට්ටම විය යුතුය.

(i) මොරටුව විශ්වවිද්‍යාලයෙන් හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව;

හෝ

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

හෝ

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

හෝ

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

(*ඇ*) *කායික සුදුසුකම්* :

(i) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය.
(ii) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික වශයෙන් යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
(iii) උස අවම වශයෙන් අඩි 05 අඟල් 04 ක් විය යුතු අතර, ප්‍රාශ්වාසයේ දී පපුව අඟල් 32ට නොඅඩු විය යුතු ය.
(iv) 6/6, 6/6 අක්ෂි දෘෂ්ටි පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

(*ඈ*) *වෙනත් සුදුසුකම්* :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් ද යුක්ත විය යුතු ය.
(iii) අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබනුයේ පිරිමි අයදුම්කරුවන් පමණි.

සටහන.—මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලබන දිනට ඉහත සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයැදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

ඉහත (04) හි දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා විවෘත ලිඛිත තරග විභාගයක් පවත්වා ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල මත බඳවා ගනු ලැබේ. අයැදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේ පැවැති පුරප්පාඩු පමණක් පුරවන අතර පොරොත්තු ලේඛනවල තබා බඳවා ගැනීමක් සිදු නොකරයි.

06. *බඳවා ගැනීමේ පරීක්ෂණයේ විභාග පරිපාටිය* :

(i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

(ii) විභාග ක්‍රමය :
(*අ*) විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පැවැත්වේ.
(*ආ*) සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ ඉහත (04) යටතේ ඉල්ලා ඇති සුදුසුකම් සපුරා ඇති භාෂා මාධ්‍යයෙනි. ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(iii) විභාගයේ විෂයයන් :

(*අ*) සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය
(*ආ*) තාක්ෂණ දැනුම

(iv) විෂය නිර්දේශය :

(01) සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය
කාලය පැය 1 යි, ලකුණු 100 යි.

අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, සාමාන්‍ය දැනුම හා බුද්ධිය පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. ''මෙය ගණිත ගැටලු, සාමාන්‍ය දැනීම, පරිසරය හා ආශ්‍රිත ප්‍රශ්න 50ක් ඇතුළත් බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.''

(02) තාක්ෂණ දැනුම - කාලය පැය 03 යි. ලකුණු 100 යි.

ඩීසල් එන්ජින් තාක්ෂණය හා ඒ ආශ්‍රිත දැනුම මෙන්ම යන්ත්‍රෝපකරණ පිළිබඳ දැනුම පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොටගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. ''ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.''

(v) තේරීම් පරිපාටිය :

එක් එක් විෂයකින් ලකුණු 40%ක් බැගින් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයැදුම්කරුවන් විභාගය සමත් වූ අය සේ සැලකෙන අතර, මෙම විභාගයෙන් විෂයයන් දෙකෙන්ම වැඩි ලකුණු ලබා සමත්වන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීමක් සිදු නොකරනු ලැබේ. අයැදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේ පැවති පුරප්පාඩු සංඛ්‍යාව අනුව දුම්රිය එන්ජින් රියදුරු- III ශ්‍රේණියට පත් කරනු ලැබේ. පත්කරනු ලැබීම සඳහා අපේක්ෂකයින් තෝරාගනු ලබන්නේ ඉහත 06 හි iv යටතේ දක්වා ඇති කරුණුවලට යටත්ව විභාගයේ ඉහලම ලකුණු ලබා ඇති කුසලතා අනුපිළිවෙලට අනුව ය.

(vi) විභාග ප්‍රතිඵල :

ගැසට් නිවේදනයේ 06 (v) ඡේදය අනුව ඉහලම ලකුණු ලැබූ අපේක්ෂකයින්ගේ මුළු ලකුණු කුසලතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය දුම්රිය සාමාන්‍යාධිකාරී වෙත ලබා දෙනු ඇත.

''විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපැල් මගින් හෝ www.results. exams. gov.lk වෙබ් අඩවිය ඔස්සේ සිදු කරනු ඇත.''

07. *අයැදුම්පත් සකස් කිරීමට හා සම්පූර්ණ කිරීමට උපදෙස් :*

(i) අයැදුම්පත A 4 (යතුරුලියන කඩදාසි) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ යුතු ය.

(අයැදුම්පත තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි)

අයැදුම්පතේ—

1 වැනි පිටුවේ ශීර්ෂ අංක 01 සිට 06 තෙක් කරුණු ද,

2 වැනි පිටුවේ ශීර්ෂ අංක 07 සිට 10 තෙක් කරුණු ද,

3 වැනි පිටුවේ ශීර්ෂ අංක 11 හා 12 කරුණු ද

04 වැනි පිටුවේ ශීර්ෂ අංක 13 කරුණ ද වන පරිදි ඇතුළත් විය යුතු ය.

ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. අයැදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන අයැදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයැදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. එසේ නොවුනහොත් අයැදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. අයැදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයැදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයැදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ.

(ii) අදාළ විභාගය සඳහා විභාග ගාස්තුව රු. 600කි. එය විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලද ලදුපත අයැදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම හෝ මුද්දර භාරගනු නොලබන අතර විභාග සඳහා ගෙවන ලද ගාස්තුව කවර කරුණක් යටතේ වුව ද ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.

(iii) මෙම ලදුපතෙහි ඡායා පිටපත් ඉදිරිපත් කිරීම හෝ වෙනයම් ආකාරයකට මුදල් ගෙවීම අයැදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ. තව ද විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iv) අයැදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු - III ශ්‍රේණියට බඳවා ගැනීමේ ලිඛිත තරග විභාගය - 2016'' යන්න සඳහන් කරන්න.

(v) බාහිර අයැදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීම රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ

නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රු. 240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ ලවා සහතික කරවාගත යුතු ය.

(vi) දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු පුද්ගලයන්ගේ අත්සන් තම ආසන්නතම සේවා ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය. මොවුන්ගේ අයැදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් එවීම අනිවාර්ය වේ.

(vii) *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර අයැදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයැදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර තැපැල් මගින් එවනු ඇත. තරග විභාගයට පෙනී සිටීම සඳහා විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට් නිවේදනය* අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(viii) අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2ක් 3ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයැදුම් පත්‍රයෙහි පිටපත ද, ගෙවන ලද විභාග ගාස්තුවට අදාල ලදුපතෙහි පිටපත ද, අයදුම් පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව, අයැදුම් කරන ලද විභාගයේ නම, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය ද සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයැදුම්කරුවකු නම් ඔබගේ ඉහත විස්තර සමඟ විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත.

(ix) "විභාග අපේක්ෂකයන් විභාගයට පෙර තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කරවා ගත යුතු ය. විභාගයට පළමුවෙන්ම පෙනී සිටින දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් විභාග ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු අතර එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත."

(x) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාග වලදී අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණි.

(xi) අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(xii) විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවේ.

08. *සේවා කොන්දේසි :*

බඳවා ගනු ලබන්නේ III වැනි ශ්‍රේණිය සඳහා ය.

09. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. දැනටමත් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක වී ඇත්නම් තව දුරටත් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) විවෘත ක්‍රමය යටතේ බඳවා ගන්නා සෑම තැනැත්තෙකුම වසර දෙකක (02) ආධුනික කාලයකට (මෙම ආධුනික කාලය උපරිම වශයෙන් වසර 03ක සංශෝධනයකට යටත් විය හැක.) යටත්ය. එම කාලය තුල දුම්රිය එන්ජින් රියදුරු තනතුරට අදාලව රාජකාරි ඉටු කිරීමට අවශ්‍ය න්‍යායාත්මක දැනුම, ප්‍රායෝගික පුහුණුව හා කුසලතාවයන් වර්ධනය කර ගැනීමට අවස්ථාව සලසනු ඇත. පුහුණු කාලය තුලදී එම ආධුනිකයින් අනුයුක්ත කරනු ලබන අංශයේ අධීක්ෂණයට හා පාලනයට යටත් වන්නේය. බඳවා ගැනීමේ පරිපාටියේ 7:2 උප වගන්තියේ දැක්වෙන ක්‍රමය තුළින් සේවයට පිවිසෙන ආධුනික නිලධාරියෙකු ආධුනික පුහුණුව අවසානයේදී පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත් නොවුනහොත් එම ආධුනික නිලධාරියාගේ සේවය අවසන් කරනු ඇත.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හි විධිවිධාන අනුව රාජ්‍ය සේවයට බැඳුනු භාෂා මාධ්‍යයට අමතරව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවක් වසර 05ක් තුළ ලබා ගත යුතු ය. එම ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ලැබේ.

(iv) තෝරාගනු ලබන අපේක්ෂකයින් ආයතන සංග්‍රහයේ සහ මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධානවලටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති ආයතන කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ විධිවිධාන වලටත් යටත්ව කටයුතු කළ යුතු ය. එමෙන්ම විටින් විට රජය විසින් නිකුත් කරන නියෝග දෙපාර්තමේන්තු උපදෙස්වලට යටත්ව කටයුතු කිරීමට බැඳී සිටී.

බී. ඒ. පී. ආරියරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

(මේ අනුව A - 4 කඩදාසිවල දෙපසම භාවිත කරමින් පිළියෙල කරගත් අයැදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයැදුම්පත් කැඳවීමේ නිවේදනය කියවා හොඳින් වටහා ගත යුතු ය.)

ආදර්ශ අයැදුම්පත්‍රය

*ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු තනතුරේ - **III** ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016*

Open Competitive Examination for Recruitment for the Post of Engine Driver Grade - III,
Sri Lanka Railway Department - 2016

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

විභාගය සඳහා ඉල්ලුම් කරන මාධ්‍ය :

සිංහල - 2

දෙමළ - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන නගරය	නගරය	නගර අංකය
1 වැනි කැමැත්ත		
2 වැනි කැමැත්ත		

විභාග නිවේදනයේ ආරම්භක ඡේදය බලන්න. ඉල්ලුම් කරන නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

පුරවැසිභාවය :
පරම්පරාවෙන් - 1
ලියාපදිංචි වීමෙන් - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. මුලකුරු අගට යොද මුලකුරු සමඟ නම :
(i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා. : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
(ii) සිංහලෙන්/දෙමළෙන් :————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :
(i) අගට යොදන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)

(ii) සිංහලෙන්/දෙමළෙන් :————.

03. ස්ථිර ලිපිනය :
(i) සිංහලෙන්/දෙමළෙන් :————.

(ii) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්:————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය :

ස්ත්‍රී 1
පුරුෂ 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

06. ජන වර්ගය :
සිංහල - 1/ශ්‍රී ලංකා ද්‍රවිඩ - 2/ඉන්දියා ද්‍රවිඩ - 3
/මුස්ලිම් - 4/බර්ගර් - 5/ මැලේ - 6 (අදාළ අංකය කොටුව තුළ ලියන්න).

07. පදිංචිය :————.
(i) ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————. එහි අංකය :

(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

(iii) දිස්ත්‍රික්කය :————.

08. උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

2016.07.01 දිනට වයස : අවුරුදු : මාස : දින :

09. (අ) අධ්‍යාපන සුදුසුකම් :

(i) අ. පො. ස. (සා. පෙළ.)

විභාග අංකය:————. වර්ෂය :————.

අනු. අංකය	විෂයය	ශ්‍රේණිය
(i)		
(ii)		
(iii)		
(iv)		

අනු අංකය	විෂයය	ශ්‍රේණිය
(v)		
(vi) (vii)		
(viii)		

(ii) අ. පො. ස. (උසස් පෙළ) :

විභාග අංකය :————. වර්ෂය:————.

අනු. අංකය	විෂයය	ශ්‍රේණිය
(i)		
(ii)		
(iii)		
(iv)		

(ආ) වෘත්තීය සුදුසුකම් :

පාඨමාලාව	වර්ෂය

10. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? :————.

(අදාළ කොටුව තුළ " x " ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

11. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයැදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සහ/හෝ අසත්‍ය ලෙස සම්පූර්ණ කර තිබීමෙන් අපේක්ෂකත්වය අවලංගු වන බව හොඳින් දැන සිටිමි. ඉන් වන හානිය මම පුද්ගලිකව දරා ගනිමි.

(ආ) ඉහත (අ) හි දක්වා ඇති කරුණු අසත්‍ය බව මා තනතුරට පත්වීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් බව ද ප්‍රකාශ කරමි. ඉන් සිදුවන හානි වෙතොත් ඒවා ද මම පුද්ගලිකව දරා ගනිමි.

(ඇ) …… …… දින තැපැල් කාර්යාලයට රු. 600ක් ගෙවා ලබා ගත් අංක …… දරන ලදුපත මේ සමඟ අමුණා ඇත.

ලදුපත නොගැලවෙන සේ එහි එක් දරයක් මගින් අලවන්න. (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගන්න)

(ඈ) මෙම විභාගයේ කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.

(ඉ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

12. අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන …… මහතා මම පුද්ගලිකව හඳුනමි. ඔහු …… දින ඉහත අත්සන මා ඉදිරිපිට දී තැබූ බව ද සහතික කරමි. තවද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන.

දිනය :————.

සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.

තනතුර :————.

ලිපිනය :————.
(කරුණාකර නිල මුද්‍රාව තබන්න).

13. *දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය* : (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ..... මහතා ..... දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ..... දින සිට ..... දින දක්වා ..... වශයෙන් සේවය කර ඇත. ඔහුට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී නැත/ඇත. ඔහුගේ වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු /III ශ්‍රේණිය සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන්/ආයතනයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බව දන්වනු කැමැත්තෙමි.

(අදළ නොවන වචන කපා හරින්න.)

_____,
දෙපාර්තමේන්තු/ආයතන
ප්‍රධානියාගේ අත්සන.

දිනය :_____.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :_____.
තනතුර :_____.
ලිපිනය :_____.

(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

07-50

ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණය සහ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016

1.0 ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පටිපාටියෙහි විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් සහ පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් 2016 ඔක්තෝබර් මාසයේ දී පවත්වනු ලබන බවත් ඒ සඳහා අයදුම්පත් කැඳවන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් සඳහා මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුර, බදුල්ල, රත්නපුර හා කිලිනොච්චිය යන නගරවල දී පමණක් පැවැත්වේ. එම නගරවලට අදාළ නගර අංක පහත වගුවේ දැක්වේ. අයදුම් පත්‍රයේ අදාළ ශීර්ෂය මෙම නගර හා නගර අංක සඳහන් වගුව අනුව සම්පූර්ණ කළ යුතු වේ. ඉල්ලුම් කළ නගරය/ නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. ඉහත සඳහන් යම්කිසි මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථානය අවලංගු කර ඊට ආසන්න මධ්‍යස්ථානයක් වෙත අදාළ අයදුම්කරුවන් යොමු කෙරෙනු ඇත.

තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

නගරය	*නගර අංකය*
කොළඹ	01
මහනුවර	02
ගාල්ල	03
මාතර	04
යාපනය	05
මන්නාරම	06
මුලතිව්	07
ත්‍රිකුණාමලය	08
මඩකලපුව	09
කුරුණෑගල	10
අනුරාධපුර	11
බදුල්ල	12
රත්නපුර	13
කිලිනොච්චි	14

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා අයත් දිස්ත්‍රික්කය පිළිබඳ තොරතුරු 01 වැනි උපලේඛනයේ දැක්වේ. අයදුම්කරුවන් තමා ඉල්ලුම් කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා එහි අංකයත්, දිස්ත්‍රික්කය හා එහි අංකයත් එම උපලේඛනයේ සඳහන් පරිදි නිවැරදිව අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ සඳහන් කළ යුතුය. එය පසු අවස්ථාවක වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එම විස්තර වැරදි ලෙස සටහන් කිරීම හේතුවෙන් අයදුම්කරුවකුට සිදුවන කිසියම් අවාසියක් සම්බන්ධ කිසිදු ඉල්ලීමක් සලකා නොලබන අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා කොට්ඨාස අංකය සඳහන් කර නොමැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.0 (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල්, විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

4.0 *සුදුසුකම්* .- 2010.09.29 දින සිට ක්‍රියාත්මක ග්‍රාම නිලධාරි බඳවා ගැනීමේ පටිපාටිය අනුව ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධාරින් මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

5.0 *විභාග පටිපාටිය* : අපේක්ෂකයන් පහත දැක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

විෂය	විෂය අංකය	ලකුණු	කාලය
1. කාර්යාල ක්‍රම හා ගිණුම්	01	100 යි	පැය 02 යි
2. විෂයානුබද්ධ වෘත්තීය දැනුම	02	100 යි	පැය 02 යි
3. පරිගණක පරීක්ෂණය	03	100 යි	පැය 01 1/2 යි

5.1 කාර්යාල ක්‍රම හා ගිණුම් (විෂය අංකය - 01)

කාර්යාල ක්‍රම :

ග්‍රාම නිලධාරි කාර්යාලයේ හා රජයේ කාර්යාලවල භාවිත වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම හා රාජකාරි ලිපි ලේඛන මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස් / නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ විෂයානුබද්ධ කරුණු සම්බන්ධව වාර්තාවක් කෙටුම්පත් කිරීමේ හැකියාව ද පරීක්ෂා කෙරේ.

ගිණුම් :

ග්‍රාම නිලධාරි වෙත පැවරී ඇති රාජකාරිවලට අදාළ හා රජයේ කාර්යාලවල භාවිත වන මූලික ගිණුම් හා ගිණුම් ක්‍රම ද, මුදල් පාලන පොත්වල කාර්යයන්, ප්‍රසම්පාදන පිළිබඳව ද අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ.

I වන කොටස- කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 25යි)

II වන කොටස - ප්‍රශ්න තුනකින් සමන්විත ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න තුනටම පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 75යි)

5.2 විෂයානුබද්ධ වෘත්තීය දැනුම (විෂය අංකය - 02)

ග්‍රාම නිලධාරින්ට අදාළ විවිධ අණපනත් හා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා වෙනත් රජයේ ව්‍යවස්ථාපිත ආයතන මගින් පැවරී ඇති රාජකාරි පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ.

I වන කොටස - කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 25යි)

II වන කොටස - ප්‍රශ්න තුනකින් සමන්විත ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න තුනටම පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 75යි)

5.3 පරිගණක පරීක්ෂණය (විෂය අංක - 03)

අයදුම්කරුට පහත සඳහන් හැකියාවන් තිබේදැයි පරීක්ෂා කිරීම මෙම පරීක්ෂණයේ අරමුණ වේ.

තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික සංකල්ප,
මෙහෙයුම් පද්ධති,
ගොනු කළමනාකරණය.

වදන් සැකසුම : මූලික කුසලතා, තිරයට හුරුවීම, පාඨ සංස්කරණය, පාඨ එකේලි කිරීම, අකුරු වර්ග හා උප ලක්ෂණ, අනුඡේද, ඡේද, පේළි අතර පරතරය වෙනස් කිරීම, පිම් අනුයෝගය (Tab Settings), පාඨයක් සෙවීම හා ප්‍රතිෂ්ඨාපනය, අක්ෂර හා ව්‍යාකරණ දෝෂ, සමානාර්ථ පද,

තීරු යෙදීම, පිටුව සැකසීම,
ලේඛන මුද්‍රණය, වගු නිර්මාණය,
අනුපිළිවෙළට සැකසීම,
ගොනු කළමණාකරණය,
ලේඛනයක් ලිපිනයන් කිහිපයකට යැවීමට සැකසීම,
මැක්‍රෝ භාවිතය,

පැතුරුම් පත් : මූලික කුසලතා,
ආකෘතිකරණය (Formatting),
සංස්කරණය,
තීරු හා පරාස, නව ඇතුළත් කිරීම් හා ඉවත් කිරීම්,

	දත්ත අනුපිළිවෙළට සැකසීම, ප්‍රස්තාර සැකසීම, මුද්‍රණය, @ ශ්‍රිත (@ Functions) මැක්‍රෝ භාවිතය, ගොනු කළමනාකරණය
දත්ත සමුදාය :	හැඳින්වීම, මූලික කුසලතා, දත්ත සමුදාය නිර්මාණය හා භාවිතය, ආකෘති, සන්ධානගත ආකෘති, උත්පතන ආකෘති (popup forms) විමසුම් (queries) අනුපිළිවෙළට සැකසීම, වාර්තා ලබා ගැනීම, මැක්‍රෝ භාවිතය,
ඉදිරිපත් කිරීම්/චිත්‍ර සටහන් :	මූලික කුසලතා, සංස්කරණය, ආකෘතිකරණය, සැලසුම් යෙදීම, අනුරූප, පසුරු සිත්තම් හා ප්‍රස්තාර නිවේශනය, කදා මාරුව හා සජීවකරණය, ඉදිරිපත් කිරීමේ මෙවලම් භාවිතය, ගුරු (Master) කදාව සැකසීම, කදා මුද්‍රණය හා සටහන්,
අන්තර්ජාලය :	අන්තර්ජාලය හැඳින්වීම, විශ්ව විසිරි ජාලය, මං සොයන ආකාරය, ව්‍යවහාරික අන්තර්ජාලය
විදුලි තැපෑල : (E-Mail)	හැඳින්වීම, මූලික කුසලතා, විදුලි තැපෑල ලබා ගැනීම, විදුලි තැපෑල යැවීම හා ඊට ප්‍රතිචාර දැක්වීම. ඇමුණුම් භාවිතය, ලිපිනය හඳුනා ගැනීමට කෙටි නාම භාවිතය, පණිවුඩ සම්පාදනය,

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

I වැනි කොටස - බහුවරණ/ කෙටි පිළිතුරු ප්‍රශ්න 40 කින් යුක්ත වේ.
(ලකුණු 40 යි)

II වැනි කොටස - අර්ධ ව්‍යුහගත ප්‍රශ්න 05 කි.
(ලකුණු 60 යි)

I හා II යන කොටස් දෙකටම නියමිත කාලය පැය 1 1/2 කි.

සටහන.—2010-09-29 දිනැති ග්‍රාම නිලධාරි බඳවා ගැනීම් පටිපාටියේ ඇමුණුම් 02 හි 08 වැනි ඡේදයට අනුව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන පරිගණක මෙහෙයුම් බලපත්‍රය හෝ පරිගණක මෙහෙයුම් බලපත්‍රයට සමාන හෝ ඊට ඉහළ ගුණාත්මක අගයක් ඇති තෘතීයික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනවලින් නිකුත් කරන ලද පරිගණක පිළිබඳ සහතිකපත්‍ර ලබා ඇති නිලධරයන් මෙම පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ. තව ද ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන පරිගණක යෙදවුම් සහායක (NVQ මට්ටම 3) සහතිකය ලබා ඇති නිලධරයන් මෙම පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

6.0 සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යවලින් පමණක් මෙම විභාගය පැවැත්වෙන අතර අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

7.0 තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිවේ. එතෙකුදු වුවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) බැගින්වත් ලබාගත යුතු වේ. සියලු විෂයයන් සමත් වී විභාගය සම්පූර්ණ කරනු ලබන වර්ෂයේ විභාගය පවත්වන ලද අවසාන දිනය මෙම කාර්යක්ෂමතා කඩ ඉම සමත් වූ දිනය ලෙස සලකනු ලැබේ.

8.0 විභාග ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල් විසින් මා වෙත නිකුත් කරන අතර, විභාගය සමත් වූ අපේක්ෂකයන්ගේ නම් දිස්ත්‍රික් ලේකම්වරු හා ප්‍රාදේශීය ලේකම්වරුන් මගින් අයදුම්කරුවන්ට දැන්වීමට කටයුතු කරනු ඇත.

9.0 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් තම සේවා වසමට අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා මගින් 2016 අගෝස්තු මස 01 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

10.0 *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව* - අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතු ය. විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලබන තම අත්සන සහතික කරවාගත් විභාග ප්‍රවේශ පත්‍රය සමඟ පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය :-

I පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;

II වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අනන්‍යතාව විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

11.0 *අයදුම්පත්‍ර.*—ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 5.0 දක්වා ඡේදයන් පළමුවන පිටුවට ද 6.0 සහ 7.0 දෙවන පිටුවට ද ඇතුළත් වන පරිදි "ඒ 4"ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් අයදුම්පත්‍රය පිළියෙළ කළ යුතු ය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙළ කරගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. අයදුම්පත මේ සමඟ ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර එක් අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. තව ද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12.0 පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත් ඉන්පසු වාරවල දී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට හෝ විෂයයන් දෙකක් සඳහා පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුව රු.400/- ක් ද එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුව රු.200/- ක් ද වේ. මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට අයදුම්කරුගේ නමින්ම ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. තව ද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාග යකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

13.0 අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමඟ ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් විභාග කොමසාරිස් ජනරාල් විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

14.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

15.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවන අතර, මෙම විභාග නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති මෙම විෂයට අදාළ කවර කරුණක් පිළිබඳ වුව ද මාගේ තීරණය අවසාන තීරණය වන්නේය.

16.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2016 ජූනි මස 09 වැනි දින,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

ග්‍රාම නිලධාරි සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණය සහ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016

EFFICIENCY BAR EXAMINATION AND A WRITTEN TEST IN COMPUTER SKILLS FOR THE OFFICERS IN CLASS III OF GRAMA NILADHARI SERVICE - 2016

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :
සිංහල - 2
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

	විභාගයට ඉල්ලුම් කරන නගරය	නගර අංකය
පළමු තේරීම		
දෙවන තේරීම		

(*ගැසට්* නිවේදනයේ 2.0 ඡේදයට අනුව විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර කැමැත්ත අනුව අනුපිළිවෙලින් දක්වන්න.)
(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

1.0 1.1 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : උදා :- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම: (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):————.
(උදා. : GUNAWARDHANA, H. M. S. K.) :————.

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :————.

2.0 2.1 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 සේවය කරනු ලබන දිස්ත්‍රික්කය සහ දිස්ත්‍රික්ක අංකය :
(උපලේඛන I අනුව යොදන්න.) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.3 සේවය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය :
(උපලේඛන I අනුව යොදන්න.) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 සේවය කරනු ලබන දිස්ත්‍රික්කය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.0 3.1 ජාතික හැඳුනුම්පත් අංකය :

3.2 ස්ත්‍රී/ පුරුෂභාවය :

ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.3 උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

4.0 ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත් වන විෂයය/ විෂයයන් (ගැසට් නිවේදනයේ 05 වැනි ඡේදය බලන්න)

අනු. අංකය	*විෂයය*	*විෂය අංකය*
01		
02		
03		

5.0 5.1 අයත් වන ශ්‍රේණිය :————.
5.2 තනතුර :————.
5.3 අදාළ ශ්‍රේණියට පත්වීම ලද දිනය :————
5.3 දුරකථන අංකය :————.

6.0 *සැළකිය යුතුයි :- ගැසට් පත්‍රයේ* දැක්වෙන පරිදි විභාග ගාස්තු සඳහා නියමිත මුදල් ගෙවූ බවට තැපැල්/උපතැපැල් කාර්යාලයෙන් අයදුම්කරුගේ නමින්ම ලබා ගත් කුවිතාන්සිය මෙහි නොගැලවෙන සේ ඇලවිය යුතු ය.

කුවිතාන්සි අංකය:————.
තැපැල්/උපතැපැල් කාර්යාලය :————.
දිනය:————.
මුදල රුපියල්:————.

7.0 ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි. එසේම එම විභාගය සඳහා පළමුවරට ඉදිරිපත් වන බව ද/ විභාගයට නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය

..... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ..... ග්‍රාම නිලධාරි වසමේ සේවයේ නියුතු ග්‍රාම නිලධාරි/ ග්‍රාම නිලධාරිනි, ... මහතා/ මහත්මිය/ මෙනෙවිය විසින්,

(i) මා ඉදිරියේදී අත්සන් කළ බවත්,
(ii) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
(iii) නිලධාරියා/ නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්,
(iv) පළමුවනවරට විභාගයට පෙනී සිටින බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් බවත්/ නියමිත විභාග ගාස්තුව ගෙවන ලද ලදුපත අලවා ඇති බවත්, මම සහතික කරමි.

(නොගැලපෙන වචන කපා හරින්න.)

————,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන
සහ නිලමුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

උපලේඛනය I

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය	අයත් දිස්ත්‍රික්කය හා අංකය
කොළඹ	1103	
කොළොන්නාව	1106	
කඩුවෙල	1109	
හෝමාගම	1112	
හංවැල්ල	1115	
පාදුක්ක	1118	කොළඹ
මහරගම	1121	
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ	1124	01
තිඹිරිගස්යාය	1127	
දෙහිවල	1130	
රත්මලාන	1131	
මොරටුව	1133	
කැස්බෑව	1136	
මීගමුව	1203	
කටාන	1206	
දිවුලපිටිය	1209	
මීරිගම	1212	
මිනුවන්ගොඩ	1215	ගම්පහ
වත්තල	1218	
ජාඇල	1221	02
ගම්පහ	1224	
අත්තනගල්ල	1227	
දෙම්පේ	1230	
මහර	1233	
කැළණිය	1236	
බියගම	1239	
පානදුර	1303	
බණ්ඩාරගම	1306	
හොරණ	1309	
ඉංගිරිය	1310	
බුලත්සිංහල	1312	
මදුරාවල	1315	කළුතර
මිල්ලනිය	1318	
කළුතර	1321	
බේරුවල	1324	03
දෙඩන්ගොඩ	1327	
මතුගම	1330	
අගලවත්ත	1333	
පාලින්දනුවර	1336	
වලල්ලාවිට	1339	
තුම්පනේ	2103	
පූජාපිටිය	2106	
අකුරණ	2109	
පාතදුම්බර	2112	
පන්විල	2115	
උඩුදුම්බර	2118	
මිනිපේ	2121	මහනුවර
මැදදුම්බර	2124	
කුණ්ඩසාලේ	2127	
ගඟවට කෝරළේ	2130	04
හාරිස්පත්තුව	2133	
හතරලියද්ද	2134	
යටිනුවර	2136	
උඩුනුවර	2139	
දොළුව	2142	
පාතහේවාහැට	2145	
දෙල්තොට	2148	
උඩපළාත	2151	
ගඟඉහලකෝරළේ	2154	
පස්බාගේ කෝරළේ	2157	
ගලේවෙල	2203	
දඹුල්ල	2206	
නාඋල	2209	
පල්ලෙපොල	2212	මාතලේ
යටවත්ත	2215	
මාතලේ	2218	05
අඹන්ගඟ කෝරළේ	2221	
ලග්ගල පල්ලේගම	2224	
විල්ගමුව	2227	
රත්තොට	2230	
උකුවෙල	2233	
කොත්මලේ	2303	
හඟුරන්කෙත	2306	නුවරඑළිය
වලපනේ	2309	
නුවරඑළිය	2312	06
අඹගමුව	2315	
බෙන්තොට	3103	
බලපිටිය	3106	
කරන්දෙනිය	3109	
ඇල්පිටිය	3112	
නියාගම	3115	
තවලම	3118	
නෙළුව	3121	
නාගොඩ	3124	
බද්දේගම	3127	ගාල්ල
වැලිවිටිය දිවිතුර	3130	
අම්බලන්ගොඩ	3133	07
හික්කඩුව	3136	
කඩවත්සතර	3139	
බෝපෙ පෝද්දල	3142	
අක්මීමන	3145	
යක්කලමුල්ල	3148	
ඉමදූව	3151	
ගෝනපීනුවල	3154	
හබරාදුව	3157	
පිටබැද්දර	3203	
කොටපොල	3206	
පස්ගොඩ	3209	
මුලටියන	3212	
අතුරලිය	3215	මාතර
අකුරැස්ස	3218	
වැලිපිටිය	3221	
මාලිම්බඩ	3224	08
කඹුරුපිටිය	3227	
හක්මන	3230	
කිරින්ද පුහුලුවැල්ල	3233	
තිහගොඩ	3236	
වැලිගම	3239	
මාතර	3242	
දෙවිනුවර	3245	
දික්වැල්ල	3248	

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය	අයත් දිස්ත්‍රික්කය හා අංකය
සූරියවැව	3303	
ලුණුගම්වෙහෙර	3306	
තිස්සමහාරාමය	3309	
හම්බන්තොට	3312	
අම්බලන්තොට	3315	හම්බන්තොට
අඟුණකොලපැලැස්ස	3318	
වීරකැටිය	3321	09
කටුවන	3324	
ඕකේවෙල	3327	
බෙලිඅත්ත	3330	
තංගල්ල	3333	
වලස්මුල්ල	3336	
කයිට්ස්	4103	
චානක්කනි	4106	
සන්දිලිපායි	4109	
තෙලිප්පායි	4112	
උඩුවිල්	4115	
කෝපායි	4118	යාපනය
කරවෙඩ්ඩි	4121	
මුරුතන්කර්නි	4124	
පොයින්ට් පේදුරු	4127	10
චාවාකච්චේරි	4130	
නල්ලූර්	4133	
යාපනය	4136	
වෙලනායි	4139	
ඩෙල්ෆ්	4142	
කරෙයිනගර්	4145	
මන්නාරම	4203	
මාන්තායි බටහිර	4206	මන්නාරම
මඩු	4209	
නානද්දාන්	4212	11
මුසාලි	4215	
වවුනියා උතුර	4303	
වවුනියා දකුණ	4306	වවුනියා
වවුනියා	4309	
වෙන්ගලචේඩිකුලම්	4312	12
තුනුක්කායි	4403	
මාන්තායි නැගෙනහිර	4406	
පුදුකුඩිඉරුප්පු	4409	මුලතිව්
ඔඩ්ඩුසුඩාන්	4412	
මැරිටයිම්පත්තු	4415	13
වැලිඔය	4418	
පච්චිලෙයිපල්ලි	4503	කිලිනොච්චිය
කඳවලෙයි	4506	
කරච්චි	4509	14
පූනාකරි	4512	
කෝරළේපත්තු උතුර	5103	
කෝරළේපත්තු බටහිර	5106	
කෝරළේපත්තු	5109	මඩකලපුව
එරාවූර්පත්තු	5112	
එරාවූර් නගරය	5115	15
මන්මුනේ උතුර	5118	
මන්මුනේ බටහිර	5121	
කාත්තන්කුඩි	5124	

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය	අයත් දිස්ත්‍රික්කය හා අංකය
මන්මුනේපත්තු	5127	
මන්මුනේ නිරිත	5130	
පෝර්තිව්පත්තු	5133	
මන්මුනේ දකුණ	5136	
කෝරළේපත්තු දකුණ	5139	
කෝරළේපත්තු මධ්‍යම	5142	
දෙහිඅත්තකණ්ඩිය	5203	
පදියතලාව	5206	
මහඔය	5209	
උහන	5212	අම්පාර
අම්පාර	5215	
නාවින්දවේලි	5216	
සමන්තුරෙයි	5218	16
කල්මුණේ දමිල	5224	
සයින්ද මුරුදු	5225	
කාර්තිවු	5227	
නින්දවූර්	5230	
අඩ්ඩාලච්චේන	5233	
ඉරක්කාමම්	5234	
අක්කරපත්තුව	5236	
අලයඩිවෙම්බු	5239	
දමන	5242	
තිරුක්කෝවිල්	5245	
පොතුවිල්	5248	
ලාහුගල	5251	
කල්මුණේ මුස්ලිම්	5254	
පදවි ශ්‍රී පුර	5303	
කුච්චවේලි	5306	
ගෝමරන්කඩවල	5309	
මොරවැව	5312	ත්‍රිකුණාමලය
නගර හා කඩවත්	5315	
තඹලගමුව	5318	
කන්තලේ	5321	17
කින්නියා	5324	
මුතූර්	5327	
සේරුවිල	5330	
වෙරුගල්/ඉච්චලම්පත්තු	5333	
ගිරිබාව	6103	
ගල්ගමුව	6106	
ඇහැටුවැව	6109	
අඹන්පොල	6112	
කොටවෙහෙර	6115	
රස්නායකපුර	6118	
නිකවැරටිය	6121	
මහව	6124	
පොල්පිතිගම	6127	
ඉබ්බාගමුව	6130	
ගනේවත්ත	6133	කුරුණෑගල
වාරියපොල	6136	
කොබෙයිගනේ	6139	
බිංගිරිය	6142	18
බමුණාකොටුව	6149	
මාස්පොත	6151	
කුරුණෑගල	6154	
මල්ලවපිටිය	6157	
මාවතගම	6160	

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය	අයත් දිස්ත්‍රික්කය හා අංකය
රිදීගම	6163	
වීරඹුගෙදර	6166	
කුලියාපිටිය නැගෙනහිර	6169	
කුලියාපිටිය බටහිර	6172	
උඩුබද්දව	6175	
පන්නල	6178	
නාරම්මල	6181	
අලව්ව	6184	
පොල්ගහවෙල	6187	
පඬුවස්නුවර නැගෙනහිර	6190	
පඬුවස්නුවර බටහිර	6193	
කල්පිටිය	6203	
වනාතවිල්ලුව	6206	
කරුවලගස්වැව	6209	
නවගත්තේගම	6212	
පුත්තලම	6215	
මුන්දලම	6218	පුත්තලම
මහකුඹුක්කඩවල	6221	
ආණමඩුව	6224	19
පල්ලම	6227	
ආරච්චිකට්ටුව	6230	
හලාවත	6233	
මාදම්පෙ	6236	
මහවැව	6239	
නාත්තන්ඩිය	6242	
වෙන්නප්පුව	6245	
දංකොටුව	6248	
පදවිය	7103	
කැබිතිගොල්ලෑව	7106	
මැදවච්චිය	7109	
මහවිලච්චිය	7112	
මධ්‍යම නුවරගම්පළාත	7115	
රඹෑව	7118	
කහටගස්දිගිලිය	7121	
හොරොව්පතාන	7124	
ගලෙන්බිඳුනුවැව	7127	
මිහින්තලේ	7130	
නැගෙනහිර නුවරගම්පළාත	7133	
නච්චදූව	7136	අනුරාධපුරය
නොච්චියාගම	7139	
රාජාංගනය	7142	20
තඹුත්තේගම	7145	
තලාව	7148	
තිරප්පනේ	7151	
කැකිරාව	7154	
පළගස්වැව	7157	
ඉපලෝගම	7160	
ගල්නෑව	7163	
පලාගල	7166	
හිඟුරක්ගොඩ	7203	
මැදිරිගිරිය	7206	
ලංකාපුර	7209	පොළොන්නරුව
වැලිකන්ද	7210	
දිඹුලාගල	7212	
තමන්කඩුව	7215	21
ඇලහැර	7218	

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය	අයත් දිස්ත්‍රික්කය හා අංකය
මහියංගනය	8103	
රිදීමාලියද්ද	8106	
මීගහකිවුල	8109	
කන්දෙකැටිය	8112	
සොරණාතොට	8115	
පස්සර	8118	
ලුණුගල	8119	බදුල්ල
බදුල්ල	8121	
හාලිඇල	8124	
ඌව පරණගම	8127	22
වැලිමඩ	8130	
බණ්ඩාරවෙල	8133	
ඇල්ල	8136	
හපුතලේ	8139	
හල්දුම්මල	8142	
බිබිල	8203	
මඩුල්ල	8206	
මැදගම	8209	
සියඹලාන්ඩුව	8212	
මොණරාගල	8215	
බඩල්කුඹුර	8218	මොණරාගල
බුත්තල	8221	
වැල්ලවාය	8224	23
කතරගම	8227	
තණමල්විල	8230	
සෙවනගල	8233	
ඇහැලියගොඩ	9103	
කුරුවිට	9106	
කිරිඇල්ල	9109	
රත්නපුර	9112	
ඉඹුල්පෙ	9115	
බලංගොඩ	9118	
ඕපනායක	9121	රත්නපුර
පැල්මඩුල්ල	9124	
ඇලපාත	9127	
අයගම	9130	24
කලවාන	9133	
නිවිතිගල	9136	
කහවත්ත	9139	
ගොඩකවෙල	9142	
වැලිගෙපොල	9145	
ඇඹිලිපිටිය	9148	
කොලොන්න	9151	
රඹුක්කන	9203	
මාවනැල්ල	9206	
අරණායක	9209	
කෑගල්ල	9212	
ගලිගමුව	9215	කෑගල්ල
වරකාපොල	9218	
රුවන්වැල්ල	9221	25
බුලත්කොහුපිටිය	9224	
යටියන්තොට	9227	
දෙහිඕවිට	9230	
දැරණියගල	9233	

07-82

රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2015 (2016)

සීමිත තරග විභාගයක් මගින් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථානයන්හි ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියේ පුරප්පාඩු 781 ක් සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2015 (2016) " යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තව ද විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. මෙම තරග විභාගය සඳහා ඉල්ලුම් කරන නිලධාරීන්ට විවෘත තරග විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ හැකියාවක් නොමැත.

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය - 2016.07.29

සටහන .- ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

(අ) ලිඛිත විභාගයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් සහිත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කෙරේ. ලිඛිත විභාගයෙන් සෑම විෂයයක් සඳහාම සමත් වීමට අවශ්‍ය 40% ක් වූ අවම ලකුණු සංඛ්‍යාව ලැබූවන් හා ඊට ඉහළ ලකුණු ලැබූවන් අතුරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු සංඛ්‍යාව ව්‍යුහගත හා ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලයට ලබා දෙනු නොලැබේ. ව්‍යුහගත හා ප්‍රායෝගික සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමය මෙම නිවේදනයේ අංක 09 යටතේ දක්වා ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ලිඛිත පරීක්ෂණය හා ව්‍යුහගත පරීක්ෂණයේ දේශන පැවැත්වීමේ ප්‍රායෝගික කුසලතාව යන දෙකෙහිම අවම සමත් ලකුණු ලැබූ අයදුම්කරුවන් අතුරින් මුළු ලකුණු සංඛ්‍යාව පදනම්ව ඉහළම ලකුණු ලැබූ අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සේවයට බඳවා ගනු ලැබේ. සමාන ලකුණු ලබා ඇති අපේක්ෂකයින් එක් අයෙකුට වඩා සිටීනම් ඒ පිළිබඳ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලැබේ. පත්වීම් ක්‍රියාත්මක වන දිනය සහ පත් කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත. ලිඛිත විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන්ම බඳවා ගනු ලැබේ. සෑම අයදුම්කරුවෙකුම අයදුම්කරන විෂයයේ භාෂා මාධ්‍යයෙන් ලිඛිත විභාගයට පෙනී සිට ඉන් සමත් විය යුතු අතර ප්‍රායෝගික පරීක්ෂණය ද එම භාෂා මාධ්‍යයෙන්ම සිදු කළ යුතුවේ.

(ආ) සීමිත තරග විභාගය මගින් සම්පූර්ණ කරනු ලබන පුරප්පාඩු සංඛ්‍යාවන් පහත දක්වා ඇත. බඳවා ගනු ලබන අයදුම්කරුවන්ගෙන් ලකුණු අනුපිළිවෙල පදනම් කරගෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථානවල පුරප්පාඩු සම්පූර්ණ කරනු ලබයි. එක් අයදුම්කරුවෙකුට එකම භාෂා මාධ්‍යයේ පහත පුරප්පාඩු දක්වා ඇති විෂයයන් 03ක් සඳහා ඉල්ලුම් කළ හැකිය. එක් අපේක්ෂකයෙකු විෂයයන් කිහිපයකට සුදුසුකම් ලැබුවහොත් ඔහු තම අයදුම්පතේ විෂයයන් ඉල්ලුම්කර ඇති අනුපිළිවෙල අනුව බඳවා ගන්නා විෂයය තීරණය කරනු ලැබේ.

විෂයය	*මාධ්‍යය*	*පුරප්පාඩු සංඛ්‍යාව*
වෘත්තීය විෂයය	සිංහල	113
	දෙමළ	74
	ඉංග්‍රීසි	16
සිංහල භාෂාව (මව්බස)	සිංහල	81
සිංහල භාෂාව (දෙවන බස)	සිංහල	10
දෙමළ භාෂාව (මව් බස)	දෙමළ	79
දෙමළ භාෂාව (දෙවන බස)	දෙමළ	10
ඉංග්‍රීසි	ඉංග්‍රීසි	98
සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය	සිංහල	20
	දෙමළ	15
	ඉංග්‍රීසි	5
නැටුම්	සිංහල	8
	දෙමළ	3
නැටුම් (භරත)	දෙමළ	2
සංගීතය	සිංහල	7
	දෙමළ	3

විෂයය	මාධ්‍යය	පුරප්පාඩු සංඛ්‍යාව
සංගීතය (කර්ණාටක)	දෙමළ	3
බටහිර සංගීතය	ඉංග්‍රීසි	2
චිත්‍ර	සිංහල	14
	දෙමළ	7
	ඉංග්‍රීසි	2
නාට්‍ය හා රංග කලාව	සිංහල	8
	දෙමළ	5
	ඉංග්‍රීසි	1
තොරතුරු සන්නිවේදන තාක්ෂණය	ඉංග්‍රීසි	16
ප්‍රාථමික අධ්‍යාපනය - මව්බස	සිංහල	8
	දෙමළ	4
ප්‍රාථමික අධ්‍යාපන - සෞන්දර්ය අධ්‍යාපනය	සිංහල	3
	දෙමළ	3
ප්‍රාථමික අධ්‍යාපන - ශාරීරික අධ්‍යාපනය	සිංහල	5
	දෙමළ	3
ප්‍රාථමික අධ්‍යාපන - විශේෂ අධ්‍යාපනය	සිංහල	2
	දෙමළ	3
ප්‍රාථමික අධ්‍යාපන - නිර්මාණ කුසලතා	සිංහල	6
	දෙමළ	2
ප්‍රාථමික අධ්‍යාපන - ඉංග්‍රීසි	ඉංග්‍රීසි	7
ප්‍රාථමික අධ්‍යාපන - ප්‍රාථමික විද්‍යාව	සිංහල	3
	දෙමළ	2
ප්‍රාථමික අධ්‍යාපන - ප්‍රාථමික ගණිතය	සිංහල	10
	දෙමළ	3
බුද්ධ ධර්මය	සිංහල	10
කතෝලික ධර්මය / ක්‍රිස්තු ධර්මය	සිංහල	3
	දෙමළ	3
හින්දු ධර්මය	දෙමළ	3
ඉස්ලාම් ධර්මය	දෙමළ	2
ගණිතය	සිංහල	8
	දෙමළ	7
	ඉංග්‍රීසි	5

විෂයය	මාධ්‍යය	පුරප්පාඩු සංඛ්‍යාව
ජීව විද්‍යාව	සිංහල	3
	දෙමළ	3
	ඉංග්‍රීසි	2
රසායන විද්‍යාව	සිංහල	5
	දෙමළ	3
	ඉංග්‍රීසි	3
භෞතික විද්‍යාව	සිංහල	5
	දෙමළ	3
	ඉංග්‍රීසි	3
යාන්ත්‍රික තාක්ෂණය	සිංහල	1
	දෙමළ	1
ඉදිකිරීම් තාක්ෂණය	සිංහල	2
	දෙමළ	1
විදුලි හා ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය	සිංහල	1
	දෙමළ	1
ශිල්ප කලා (මැටි ශිල්පය සහ හස්ත කර්මාන්තය)	සිංහල	1
	දෙමළ	1
පේෂ කර්ම තාක්ෂණය	දෙමළ	1
පුරවැසි අධ්‍යාපනය	සිංහල	5
	දෙමළ	2
	ඉංග්‍රීසි	1
ඉතිහාසය	සිංහල	1
භූගෝල විද්‍යාව	සිංහල	2
	දෙමළ	2
පුස්තකාල හා තොරතුරු අධ්‍යයනය	සිංහල	1
	දෙමළ	1
	ඉංග්‍රීසි	2
කෘෂි විද්‍යාව	සිංහල	3
	දෙමළ	1
විශේෂ අධ්‍යාපනය	සිංහල	2
	දෙමළ	2
ගෘහ ආර්ථික විද්‍යාව	සිංහල	2
	දෙමළ	4
ව්‍යවසායකත්ව අධ්‍යයනය	සිංහල	3

02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

I. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1925/37 සහ 2015.07.28 වැනි දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද හා ඉන් පසුව කරන ලද සංශෝධන අනුව ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසි වලටද එම ව්‍යවස්ථා සංග්‍රහයට මින් මතු කෙරෙන සංශෝධනවලටද රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසි වලටද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයන් සේවයේ III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් අවුරුදු වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ.

III. ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියට පත්වී වසර 03 ක් ඉකුත් වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

IV. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශාංගික වන චක්‍රලේඛ අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාල ප්‍රවීණතා මට්ටම පත්වීමේ දින සිට වසර පහක් (05) ඇතුළත ලබා ගත යුතුවේ. රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් වසර තුනක් (03) තුළදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, සේවයට බඳවා ගනු ලැබූ නිලධාරියෙකු බඳවා ගැනීමේ දින සිට වසර තුනක් (03) ඇතුළත සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. නිලධාරියෙකු අ.පො.ස (සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයකින් සමත්ව ඇත්නම් සන්ධාන භාෂා පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. සෙසු නිලධාරීන් සේවා ව්‍යවස්ථාවේ උපලේඛන "VIII" සඳහන් පරීක්ෂණය සමත් විය යුතුය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බඳවා ගත් නිලධාරියෙකු මෙම අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ.

V. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ සහ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදුකර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

VI. නේවාසික පහසුකම් සලසා ඇති විට අධ්‍යාපන විද්‍යාපීඨ සීමාව තුළ පදිංචි විය යුතුය. නේවාසික පහසුකම් නොමැති විටදී සීමිත දුර ප්‍රමාණයක් තුළ පදිංචි වීමට අවසර දෙනු ලැබේ. එහෙත් විද්‍යාපීඨ සීමාව තුළ නිවාස පහසුකම් සැලසූ විටක එහි පදිංචි විය යුතුය.

03. වැටුප් පරිමාණය :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 දරන වැටුප් චක්‍රලේඛයට අනුව S:- 1-2006 හි රු. 22,935-10x645-8x790-17x1050- රු. 53,555/= ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

04. අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද :

I. *අධ්‍යාපන සුදුසුකම් :*

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් අදාළ විෂයය ක්ෂේත්‍රයේ උපාධියක් හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් ලබා තිබීම;

හෝ

අදාළ විෂයය ක්ෂේත්‍රයේ අධ්‍යාපනවේදී උපාධිය ලබා තිබීම

සටහන :- පහත සඳහන් විෂයයන් සම්බන්ධයෙන් එහි දක්වා ඇති සුදුසුකම් අවම සුදුසුකම් ලෙස භාරගනු ලැබේ.

(අ) විශේෂ අධ්‍යාපනය :

(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් විශේෂ අධ්‍යාපන විෂයය සහිත පශ්චාත් උපාධිය සමග පූර්ණ කාලීනව වසර 5ක අදාළ විෂයය ක්ෂේත්‍රයෙහි ඉගැන්වීමේ පළපුරුද්ද; *හෝ*

(ii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග අදාළ විෂයය ක්ෂේත්‍රයෙන් ලබාගත් පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ විශේෂ අධ්‍යාපනය පිළිබඳ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ විශේෂ අධ්‍යාපනය පිළිබඳ ගුරු පුහුණු සහතිකය සහ අදාළ විෂයය ක්ෂේත්‍රයේ පූර්ණ කාලීනව වසර 6ක ඉගැන්වීමේ පළපුරුද්ද; *හෝ*

(iii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක් හා අදාළ විෂයය ක්ෂේත්‍රයෙහි පූර්ණ කාලීනය වසර 7ක ඉගැන්වීමේ පළපුරුද්ද; *හෝ*

(iv) විශේෂ අධ්‍යාපනය පිළිබඳ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ අදාළ විෂයය ක්ෂේත්‍රයෙහි ගුරු පුහුණු සහතිකය සමග පූර්ණ කාලීනව වසර 7 කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද තිබීම.

(ආ) තොරතුරු තාක්ෂණය :

(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ / පරිගණක විද්‍යාව පිළිබඳ පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ හෝ උපාධියක් ලබා තිබීම; *හෝ*

(ii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ / පරිගණක විද්‍යාව පිළිබඳ උපාධියක් හා අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම; *හෝ*

(iii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ / පරිගණක විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ පිළිගත් විශ්ව විද්‍යාලයකින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් හෝ සමග තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඉගැන්වීම පිළිබඳ වසර 5 කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම; *හෝ*

(iv) පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණ/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/පරිගණක විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ තොරතුරු තාක්ෂණ /තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය සමග තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඉගැන්වීම පිළිබඳ වසර 5 කට නොඅඩු *අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම; හෝ*

(v) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂයය ක්ෂේත්‍රයක් යටතේ ලබාගත් උපාධියක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සමග තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඉගැන්වීම පිළිබඳ වසර 6ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම; *හෝ*

(vi) පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණ /තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/පරිගණක විද්‍යාව පිළිබඳ උපාධියක් හා වසර 07කට නොඅඩු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඉගැන්වීමේ පළපුරුද්ද තිබීම.

(ඇ) බටහිර සංගීතය :

(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අද ාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳව ලබාගත් උපාධියක් හා වසර 7 කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද; *හෝ*

(ii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග අද ාළ විෂයය ක්ෂේත්‍රයෙන් ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය හා වසර 7කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද; *හෝ*

(iii) බටහිර සංගීතය විෂයය ක්ෂේත්‍රයෙන් ලබාගත් ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය හා අදාළ පුහුණුවෙන් පසු වසර 7කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද; *හෝ*

(iv) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද අදාළ විෂයය පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් හා වසර 10කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද; *හෝ*

(v) පහත සඳහන් ආයතනයකින් බටහිර සංගීතය viii වන ශ්‍රේණිය ප්‍රායෝගික හා ලිඛිත පරීක්ෂණය සමත්වීම සමග වසර 7කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම.

(a) Department of Examinations, Sri Lanka
(b) Trinity College of Music, London
(c) Royal School of Music, London
(d) Londan College of Music
(e) Institute of Western Music and Speech, Colombo

(ඈ) ඉංග්‍රීසි :

(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් සහිතව දෙවන භාෂාවක් වශයෙන් ඉංග්‍රීසි ඉගැන්වීම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව *සමග වසර 6ක ඉගැන්වීමේ පළපුරුද්ද;* හෝ

(ii) ඉංග්‍රීසි පිළිබඳ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය හෝ ඉංග්‍රීසි ගුරු පුහුණු සහතිකය සමග ගුරු පුහුණුවෙන් පසු වසර 7කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම.

(ඉ) ශාරීරික අධ්‍යාපනය :

(i) ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් හා වසර 7කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද; *හෝ*

(ii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ක්‍රීඩා අමාත්‍යාංශය මගින් ලබාගත් ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා පිළිබඳ ඩිප්ලෝමාවක් සහ ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා පිළිබඳ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය සමග පුහුණුවෙන් පසු වසර 6කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද; *හෝ*

(iii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂයය ධාරාවක උපාධියක් හා පිළිගත් විශ්ව විද්‍යාලයක ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධිය සමග වසර 6ක ශාරීරික අධ්‍යාපනය ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම; හෝ

(iv) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂයය ධාරාවක උපාධියක් සමග සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂයය පිළිබඳ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය හෝ ගුරු පුහුණු සහතිකය ලබා වසර 6කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද තිබීම.

(ඊ) තාක්ෂණික විෂයයන්

I. ඉදිකිරීම් තාක්ෂණය
II. යාන්ත්‍රික තාක්ෂණය
III. කලා ශිල්ප
IV. විදුලි හා විද්‍යුත් තාක්ෂණය
V. ගෘහ ආර්ථික විද්‍යාව

(i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ ලබාගත් උපාධියක් හා වසර 07කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද; *හෝ*

(ii) අදාළ විෂයයෙන් ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය හා වසර 07කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද; *හෝ*

(iii) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් හා අදාළ විෂයය පිළිබඳ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය සමග වසර 6කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද; *හෝ*

(iv) අදාළ විෂයය පිළිබඳ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය හා වසර හය (06) කට නොඅඩු අදාළ විෂයය ඉගැන්වීමේ පළපුරුද්ද සමග අදාළ විෂයය ක්ෂේත්‍රයට අදාළ පහත සඳහන් ඕනෑම සහතිකයක් තිබීම.

(*a*) තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව; හෝ තාක්ෂණය පිළිබඳ උසස් ජාතික සහතිකය;

(*b*) තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව හෝ තාක්ෂණය පිළිබඳ ජාතික සහතිකය;

(*c*) රජයේ කාර්මික විද්‍යාලයකින් හෝ බහු තාක්ෂණික ආයතනයකින් ලබාගත් වසරකට නොඅඩු කාලයක් සඳහා වූ ඩිප්ලෝමා සහතිකය;

(*d*) සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් I,II හෝ III සහතිකය;

(*e*) NVQ V මට්ටමේ තාක්ෂණික සහතිකය.

II *පළපුරුද්ද ;*

අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට හෝ ඊට පෙර ඉහත 04(i)හි සඳහන් සුදුසුකම් සහිත රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයට අයත්, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හෝ ශ්‍රී ලංකා ගුරු සේවයේ හෝ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පත්වීම ස්ථිර කර ඇති වසර පහ (05)කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

05. *වයස් සීමාව:*

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

06. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

07. *වෙනත් සුදුසුකම්:*

(i) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයට අයත් ශ්‍රී ලංකා ගුරු සේවයේ හෝ තනතුරේ ස්ථිර කර ඇති නිලධරයෙකු විය යුතුය.

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයට අයත් ශ්‍රී ලංකා ගුරු සේවයේ පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ සියලු වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබිය යුතු අතර, එම කාලය තුළ විනායානුකූල දඬුවම් ලබා නොතිබිය යුතුය.

(iv) සීමිත තරඟ විභාගය සඳහා වාර තුන (03) කට වඩා පෙනී සිටීමට කිසිදු තැනැත්තෙකුට අවසර නොමැත.

(v) *සුදුසුකම් ලබන දිනය* - සේවයට පත් කිරීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු 04.I සිට 7 ඡේදය දක්වා සඳහන් කර ඇති අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනයට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේනම් පමණි.

08. *අයදුම් කිරීමේ ක්‍රමය :*

සේවයට බඳවා ගැනීම සඳහා පහත දක්වා ඇති විෂයයන් 37 ක් සඳහා අයදුම්පත් භාර ගනු ලැබේ. එක් අපේක්ෂකයෙකුට විෂයයන් 3 ක් සඳහා ඉල්ලුම්කළ හැකි අතර, තමා අයදුම්කරන විෂයයන් සහ ඊට අදාළ විෂය අංක අයදුම්පතේ නියමිත ස්ථානයේ සඳහන් කළ යුතුය.

විෂයය ක්ෂේත්‍රය	*විෂය අංකය*
වෘත්තීය විෂයය	01
සිංහල භාෂාව (මව්බස)	02
සිංහල භාෂාව (දෙවන බස)	03
දෙමළ භාෂාව (මව් බස)	04
දෙමළ භාෂාව (දෙවන බස)	05
ඉංග්‍රීසි	06
සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය	07
නැටුම්	08
නැටුම් (භරත)	09
සංගීතය	10
සංගීතය (කර්ණාටක)	11
බටහිර සංගීතය	12
චිත්‍ර	13
නාට්‍ය හා රංග කලාව	14
තොරතුරු සන්නිවේදන තාක්ෂණය	15
ප්‍රාථමික අධ්‍යාපනය - මව් බස	161
ප්‍රාථමික අධ්‍යාපන - සෞන්දර්ය අධ්‍යාපනය	162
ප්‍රාථමික අධ්‍යාපන - ශාරීරික අධ්‍යාපනය	163
ප්‍රාථමික අධ්‍යාපන - විශේෂ අධ්‍යාපනය	164
ප්‍රාථමික අධ්‍යාපන - නිර්මාණ කුසලතා	165
ප්‍රාථමික අධ්‍යාපන - ඉංග්‍රීසි	166
ප්‍රාථමික අධ්‍යාපන - ප්‍රාථමික විද්‍යාව	167
ප්‍රාථමික අධ්‍යාපන - ප්‍රාථමික ගණිතය	168
බුද්ධ ධර්මය	17
කතෝලික ධර්මය/ක්‍රිස්තු ධර්මය	18
හින්දු ධර්මය	19
ඉස්ලාම් ධර්මය	20
ගණිතය	21
ජීව විද්‍යාව	22
රසායන විද්‍යාව	23
භෞතික විද්‍යාව	24

විෂයය ක්ෂේත්‍රය	*විෂය අංකය*
යාන්ත්‍රික තාක්ෂණය	25
ඉදිකිරීම් තාක්ෂණය	26
විදුලි හා ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය	27
ශිල්ප කලා (මැටි ශිල්පය සහ හස්ත කර්මාන්තය)	28
පේෂ කර්ම තාක්ෂණය	29
පුරවැසි අධ්‍යාපනය	30
ඉතිහාසය	31
භූගෝල විද්‍යාව	32
පුස්තකාල හා තොරතුරු අධ්‍යයනය	33
කෘෂි විද්‍යාව	34
විශේෂ අධ්‍යාපනය	35
ගෘහ ආර්ථික විද්‍යාව	36
ව්‍යවසායකත්ව අධ්‍යයනය	37

සැ.යු. .- අයදුම්කරන විෂය ධාරාව ප්‍රධාන විෂයයන්ගෙන් එකක් ලෙස උපාධියට හදරා තිබීම අත්‍යවශ්‍ය වන අතර, උපාධිය සඳහා හදාරන මුළු විෂයය ඒකක (සම්භාර) සංඛ්‍යාවෙන් තුනෙන් එකක් වත් (1/3) අයදුම්කරන විෂයයට අදළ වන විෂයයක් විය යුතුය.

09. *බඳවා ගැනීම :*

9.1 ලිඛිත විභාගය

9.1.1 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

9.1.2 *විෂය නිර්දේශය* : විෂයයන් තුනක් යටතේ මෙම විභාගය පවත්වනු ලැබේ. ව්‍යුහගත හා ප්‍රායෝගික සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබනුයේ සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම අවම වශයෙන් 40%ක් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණි.

(i) විෂය අංක 01 : සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාව - ලකුණු 100යි. කාලය පැය 2යි.
ජාතික, කලාපීය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ මෙන්ම අප සමාජය තුළ පවතින සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික හා අනෙකුත් අදළ සාධකයන් සම්බන්ධව අපේක්ෂකයා සතු දැනුවත්භාවය සහ අවබෝධය හා පදගත, සංඛ්‍යාත්මක සහ රූපාකාර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ නිගමනයන් සහ ප්‍රතිචාර පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය හා බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(ii) විෂය අංක 02 : අවබෝධය හා සිද්ධි අධ්‍යයනය - ලකුණු 100යි - කාලය පැය 2 යි.
දෙන ලද මාතෘකාවක්/තේමාවක් ඔස්සේ අදහස් සහ තොරතුරු ඉදිරිපත් කිරීම, ගොනු කිරීම සහ විකාශනය කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කන සහ පරිකල්පන ශක්තිය මැන බැලීමට සහ තරමක් සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව සහ නිවැරදිව ප්‍රකාශ කිරීමට අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. ඊට අමතරව යම් ප්‍රස්තුත ගැටලුවකදී අපේක්ෂකයා එම ගැටලුව නිරාකරණය කිරීමට යොදා ගන්නා ක්‍රමවේද පරීක්ෂා කෙරේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(iii) විෂය අංක 03 : අධ්‍යාපන මූලධර්ම - ලකුණු 100යි. - කාලය පැය 1යි.

අධ්‍යාපන දර්ශනය, අධ්‍යාපන සමාජ විද්‍යාව, ගුරු භූමිකාව, අධ්‍යාපන ප්‍රතිපත්ති සහ නූතන ගැටලු අධ්‍යාපන සැලසුම්කරණය සහ කළමනාකරණය, අධ්‍යාපන ඇගයීම්, ඉගෙනුම් ඉගැන්වීම් උපාය මාර්ග, අධ්‍යාපන තාක්ෂණය සහ අධ්‍යාපන පර්යේෂණ යන ක්ෂේත්‍රවලට අදළව අයදුම්කරුගේ අවබෝධය මෙයින් පරීක්ෂා කරනු ලැබේ.

9.2 ව්‍යුහගත හා ප්‍රායෝගික සම්මුඛ පරීක්ෂණය :

ලිඛිත විභාගයෙන් එක් එක් විෂයය සඳහා 40% බැගින් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සඳහා පහත සඳහන් නිර්ණායක යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පහත සඳහන් පරිදි ව්‍යුහගත හා ප්‍රායෝගික පරීක්ෂණය පවත්වනු ලැබේ. (ලකුණු ලබා දීමේ පටිපාටිය උපලේඛනයෙහි ඇතුළත්ය.) සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් නොමැති වුවහොත් එවැනි අවස්ථාවන්හිදී ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

1 කොටස : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

ලකුණු ලබාදෙන නිර්ණායක	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු*
1. අතිරේක අධ්‍යාපන සුදුසුකම්	20	අදළ නොවේ
2. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය	15	
3. තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතාවය	15	

සටහන .- මෙම නිවේදනයේ සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සපුරාලන්නේ විදේශීය විශ්ව විද්‍යාලයකින් ලබාගත් සහතික මත නම් එම විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පිළිගත් අයතනයක් බවට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂමෙන් ලබාගත් තහවුරු කිරීමේ සහතිකයක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

II කොටස : ප්‍රායෝගික පරීක්ෂණය

ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ	උපරිම ලකුණු ප්‍රමාණය	තෝරා ගැනීමට සලකා බලන අවම ලකුණු ප්‍රමාණය
1. දේශන සටහන් පිළියෙල කිරීම	25	20
2. ඉදිරිපත් කිරීම	25	
2.1 පිවිසුම	04	
2.2 දේශන සැලැස්මේ කරුණු සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම	04	
2.3 ඉදිරිපත් කිරීමේ විලාශය	08	
2.4 විෂයය අන්තර්ගතය	05	
2.5. කාල කළමනාකරණය	04	

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද බන සනාථ වූ අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණය ට පෙනී සිටීමට සුදුසුකම් ලබයි. ඉහත සඳහන් පරිදි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ අයදුම්කරුවන් අතුරින් කිසියම් සංඛ්‍යාවක් ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීම සඳහ සුදුසුකම් නොලැබූවද එසේ සුදුසුකම් නොලැබූවන් වෙනුවට වෙනත් අයදුම්කරුවන් නැවත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

10. *විභාග කොන්දේසි* :

(i) විභාගය, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් තමන් ඉල්ලුම් කරන විෂයයේ භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටිය යුතුය. සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. අපේක්ෂයකුට ස්වකීය අයදුම්පත්‍රයෙහි දැක්වෙන විභාග භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(ii) විභග ගාස්තුව රු. 1000 කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදයම් ශීර්ෂ 2003-02-13ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදු පතෙහි දරයක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායාපිටපතක් ලග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

(iv) මෙම විභාගය කොළඹදී පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

(v) අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සටහන - ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(vi) ඉල්ලුම්පත්‍රය A4 ප්‍රමාණයේ කඩදසිවල දෙපැත්ත භාවිතා කරමින් සකස් කළ යුතු අතර, 01 සිට 04 තෙක් ශීර්ෂ පළමුවැනි පිටුවටද, 05 සිට ඉදිරියට ශීර්ෂ දෙවැනි, තුන්වැනි, හා හතරවැනි පිටුවලටද වන ලෙස සකස් කළ යුතුය. අදළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ඉල්ලුම්පත්‍රත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදළ ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ලග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත් එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩි දුරටත් දන්වමි.

(vii) ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, ඉල්ලුම් කරන විෂයය හා සංකේත අංකය, අයදුම්කරුගේ අත්සන, විදුහල්පතිගේ සහතිකය හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම්, දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් ම විමසා

සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදනමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(viii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

(ix) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

(x) *අපේක්ෂකයාගේ අනන්‍යතාවය* - විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයකුම විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. පහත සඳහන් ලේඛන වලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,

සැ.යු. - *(අ)* අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ පිටපතක් නොඇමිණිය යුතුය,
(ආ) ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

(xi) අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අවස්ථාවේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. ඉදිරිපත් කර ඇති යම් කරුණක් සාවද්‍ය බව තනතුරට තෝරා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින්ම යටපත් කර ඇත්නම් හෝ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

(xii) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවෙකුම තම අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා සහතික කරවා ගැනීම අනිවාර්ය වේ.

(xiii) *ප්‍රතිඵල නිකුත් කිරීම :*

ලිඛිත පරීක්ෂණයෙහි සුදුසුකම් ලැබූ අයගේ ලේඛනය ගැසට් නිවේදනයේ 9.1.2 ඡේදය අනුව ලේකම්, රාජ්‍ය සේවා කොමිෂම වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.exam.results.gov.lk වෙබ් අඩවියේ පළකිරීම සිදු කරනු ඇත.

(xiv) මෙම පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩබ්ලිව්. එම්. බන්දුසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2016 ජූනි මස 10 වැනි දින.

උපලේඛනය

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 3 ශ්‍රේණියට සීමිත බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ලකුණු පරිපාටිය (දෙවන බස සිංහල සහ දෙවන බස දෙමළ හැර අනෙකුත් විෂයයන් සඳහා).

I කොටස - උපරිම ලකුණු 50

සැ. යු. - ගැසට් නිවේදනයේ 04 ඡේදයෙහි සඳහන් සුදුසුකම් වලට අමතරව ලබා ඇති සහතික සඳහා උපරිම ලකුණු සීමාවට යටත්ව ලකුණු ලබා දෙනු ලැබේ.

01. *අධ්‍යාපන සුදුසුකම්* — *උපරිම ලකුණු 20*

1.1	පශ්චාත් උපාධිය හෝ ඊට ඉහල (අධ්‍යාපන හෝ අදාල විෂයය පිළිබඳ)	- 12
1.2	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	- 08

02. *ඉංග්‍රීසි භාෂා නිපුණතාවය* — *උපරිම ලකුණු 15*

2.1	උපාධියට ඉංග්‍රීසි විෂයක ලෙස හදාරා තිබීම	- 15
2.2	උපාධියට ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම	- 12
2.3	අ.පො.ස. (උ.පෙළ) ඉංග්‍රීසි විෂයක් ලෙස සමත් වීම	- 10
2.4	අ.පො.ස. (උ.පෙළ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම	- 08
2.5	විශ්ව විද්‍යාලයක හෝ පිළිගත් ආයතනයක ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම (වසරක් හෝ ඊට වැඩි)	- 06
2.6	පිළිගත් විශ්වවිද්‍යාලය සහතික පත්‍ර පාඨමාලාව	- 04
2.7	අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි විෂයය සඳහා විශිෂ්ඨ/අධි සම්මාන/ සම්මාන සාමාර්ථය	- 02

03. *තොරතුරු තාක්ෂණ දැනුම* *උපරිම ලකුණු 15*

3.1	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධිය	-	15
3.2	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උපාධිය	-	12
3.3	උපාධිය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයක් ලෙස හදරා තිබීම	-	10
3.4	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (අවුරුදු 1ට හෝ ඊට වැඩි)	-	08
3.5	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (මාස 06ට වැඩි)	-	06
3.6	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (මාස 06 දක්වා)	-	04

මුළු ලකුණු **50**

II කොටස - ප්‍රායෝගික පරීක්ෂණය - උපරිම ලකුණු 50

01.	පරීක්ෂණ මණ්ඩලය මගින් විෂයට අදාළව ලබාදෙන මාතෘකාවක් යටතේ දේශනයක් පැවැත්වීම සඳහා වූ දේශන සටහන් පත්‍රයක් පිළියෙල කිරීම	25
02.	එම සටහන් පත්‍රයේ සඳහන් කරුණු වලට අදාළව දේශනයක් පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ පැවැත්වීම	25
	මුළු ලකුණු	**50**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 3 ශ්‍රේණියට සීමිත බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ලකුණු පරිපාටිය
(දෙවන බස සිංහල සහ දෙවන බස දෙමළ විෂයයන් සඳහා)

I කොටස - උපරිම ලකුණු 50

සැ.යු. : ගැසට් නිවේදනයේ 04 ඡේදයෙහි සඳහන් සුදුසුකම් වලට අමතරව ලබා ඇති සහතික සඳහා උපරිම ලකුණු සීමාවට යටත්ව ලකුණු ලබා දෙනු ලැබේ.

01. *අධ්‍යාපන සුදුසුකම්* *උපරිම ලකුණු 20*

1.1	පශ්චාත් උපාධිය හෝ ඊට ඉහල (අධ්‍යාපන හෝ අදාල විෂයය පිළිබඳ)	10
1.2	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	06
1.3	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සිංහල/දෙමළ II මට්ටම සමත් හෝ අ.පො.ස. (සා.පෙළ) දෙවන බස සිංහල / දෙමළ විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ වාචික පරීක්ෂණය සමත්වීම	04

(මේ යටතේ දෙවන බස සිංහල විෂයය සඳහා දෙමළ භාෂා සහතිකද දෙවන බසදෙමළ විෂයය සඳහා සිංහල භාෂා සහතිකද සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.)

02. ඉංග්‍රීසි භාෂා නිපුණතාවය *උපරිම ලකුණු 15*

2.1	උපාධියට ඉංග්‍රීසි විෂයක් ලෙස හදාරා තිබීම	15
2.2	උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම	12
2.3	අ.පො.ස (උ.පෙළ) ඉංග්‍රීසි විෂයක් ලෙස සමත් වීම	10
2.4	අ.පො.ස (උ.පෙළ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම	08
2.5	විශ්ව විද්‍යාලයක හෝ පිළිගත් ආයතනයක ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම(වසරක් හෝ ඊට වැඩි)	06
2.6	පිළිගත් විශ්ව විද්‍යාලය සහතික පත්‍ර පාඨමාලාව	04
2.7	අ.පො.ස (සා.පෙළ) ඉංග්‍රීසි විෂයය සඳහා විශිෂ්ඨ/අධි සම්මාන/ සම්මාන සාමාර්ථය	02

03. තොරතුරු තාක්ෂණ දැනුම *උපරිම ලකුණු 15*

3.1	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධිය	15
3.2	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උපාධිය	12
3.3	උපාධිය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයක් ලෙස හදාරා තිබීම	10
3.4	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (අවුරුදු 1ට හෝ ඊට වැඩි)	08
3.5	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (මාස 06ට වැඩි)	06
3.6	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (මාස 06 දක්වා)	04

මුළු ලකුණු *50*

II කොටස - ප්‍රායෝගික පරීක්ෂණය - උපරිම ලකුණු 50

01.	පරීක්ෂණ මණ්ඩලය මගින් විෂයයට අදාළව ලබාදෙන මාතෘකාවක් යටතේ දේශනයක් පැවැත්වීම සඳහා වූ දේශන සටහන් පත්‍රයක් පිළියෙල කිරීම	25
02.	එම සටහන් පත්‍රයේ සඳහන් කරුණු වලට අදාළව දේශනයක් පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ පැවැත්වීම	25
	මුළු ලකුණු	**50**

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2015 (2016)
(Limited Competitive Examination for Recruitment to Grade III of the Sri Lanka Teacher Educators Service -2015(2016)

(කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පිටපත් දෙකකින් ඉදිරිපත් කරන්න)

විභාගයට පෙනී සිටින මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3 (අදළ අංකය කොටුව තුළ ලියන්න.)
ඉංග්‍රීසි - 4

ඉල්ලුම් කරන විෂයය හා විෂය අංකය පහත දැක්වෙන වගුවේ සඳහන් කරන්න. (ගැසට් නිවේදනයෙහි අංක 08 ඡේදයට අදළව)

අනු. අංකය	විෂයය	විෂයය අංකය
1		
2		
3		

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————————————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDENA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————————————.
(උදා : GUNAWARDENA, H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :————————————.

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————————————.
2.2 පෞද්ගලික දුරකථන අංකය (තිබේනම්) :————————————.
2.3 රාජකාරී ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————————————.
2.4 රාජකාරී දුරකථන අංකය (තිබේනම්) :————————————.
2.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) :————————————.
2.6 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————————————.

3.0 ස්ත්‍රී / පුරුෂ භාවය:

පුරුෂ - 0 (අදළ අංකය කොටුව තුළ ලියන්න)
ස්ත්‍රී - 1

4.0 ජාතික හැඳුනුම්පත් අංකය :

5.0 5.1 ජනවර්ගය :

(අදළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල - 1
දෙමළ - 2
ඉන්දියානු දෙමළ - 3
මුස්ලිම් - 4
වෙනත් - 5

5.2 විවාහක / අවිවාහක බව :

(අදළ අංකය කොටුව තුළ ලියන්න)

අවිවාහක - 1
විවාහක - 2

5.3 උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

5.4 2016.07.29 දිනට වයස

අවුරුදු: ☐☐ මාසඃ ☐☐ දිනඃ ☐☐

6.0 *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) (i) උපාධිය හෝ වෙනත් සුදුසුකම් ලබා ගත් දිනය (වලංගු දිනය)
(ii) උපාධිය/වෙනත් සුදුසුකම් (නම) :————————.
(iii) හදාරන ලද ප්‍රධාන විෂයයන් :————————.
(iv) විශ්වවිද්‍යාලය/ආයතනය :————————.
(v) බාහිර/අභ්‍යන්තර :————————.

(ආ) (i) පශ්චාත් අධ්‍යාපන උපාධි ඩිප්ලෝමාව සමත් දිනය :————————.
(ii) හදාරන ලද විෂයයන් :————————.
(iii) විශ්ව විද්‍යාලය/ආයතනය :————————.

(ඇ) 4 (i)හි සටහන යටතේ ඉල්ලුම්කරනුයේ නම්,

(i) සටහනේ දක්වා ඇති විෂය අංකය :————————

(ii) සටහනේ දක්වා තිබෙන සුදුසුකමට අදාළ අංකය :————————.

7.0 (i) ගුරුවරයකු වශයෙන් මුලින්ම රජයේ සේවයට පත් වූ දිනය :————————.
(ii) එම ගුරු පත්වීම ලබා දී ඇති විෂයය :————————

(iii) දැනට සේවය කරන අධ්‍යාපන කලාපය :————————

(iv) 2016.07.29 දිනට සේවා කාලය :
අවු: —— මාසඃ ——. දිනඃ——.

8.0 (i) ගුරු පුහුණුව ලත් වර්ෂය :————————.
(ii) ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ/ගුරු විදුහලේ නම :————————.
(iii) පුහුණු සහතිකය වලංගු වන දිනය :————————
(iv) පුහුණුව ලත් විෂයය ක්ෂේත්‍රය :————————
(v) පුහුණුවට අදාළ විෂයය සඳහා ගුරු පත්වීම ලද දිනය :————————.
(vi) එම පත්වීම් දින සිට 2016.07.29 දිනට සේවා කාලයඃ
අවු: ——.මාසඃ——. දිනඃ————.

9.0 ඔබ දැනට දරන තනතුරේ සේවය ස්ථිර කරනු ලැබ ඇත්තේද? :————————.

10.0 ඔබ රජයේ සේවයට ඇතුලත් වීම සඳහා සුදුසුකම් ලැබූ විභාගය සමත් වූ භාෂාව සඳහන් කරන්න :————————.

11.0 විභාග ගාස්තු :

විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවන්න (ලදුපතේ ඡායා පිටපතක් ලඟ තබා ගන්න)

12.0 මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය අනුව සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක .....හා .....දින දරන ලදුපත මීට අමුනා ඇතිබවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීතිරීති වලට අනුව ක්‍රියා කිරීමටත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවතිද්දී හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හෝ ගනු ලබන යම් තීරණයකටත් මම එකඟ වෙමි. මා මෙම තනතුරට තෝරා ගැනීමෙන් පසුව වුවද නුසුදුසු බව පෙනී ගියහොත් මා සේවයෙන් පහ කිරීමටත් යටත් වන බව දනිමි.

.....
අයදුම්කරුගේ අත්සන.

දිනය .....

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ..... පූජ්‍ය/මහතා/මහත්මිය/මෙනවිය මගේ විද්‍යාලයේ සේවය කරන ගුරුවරයෙක් බව මෙයින් සහතික කරමි.

....
දිනය විදුහල්පතිගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න)

විභාග කොමසාරිස් ජනරාල්,

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ..... පූජ්‍ය/මහතා/මහත්මිය/මෙනවිය මගේ කලාපයේ .....සේවය කරන ගුරුවරයෙකු බවත්, අංක 01 සිට අංක 10 දක්වා වූ ඡේදවල සඳහන් කරන ලද විස්තර කාර්යාලයේ ඇති ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

....
දිනය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
(නිල මුද්‍රාව තබන්න)

07-210/2

රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015 (2016)

විවෘත තරග විභාගයක් මගින් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථානයන්හි ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියේ පුරප්පාඩු 409 ක් සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2015 (2016) " යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. තව ද විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. මෙම තරග විභාගය සඳහා ඉල්ලුම් කරන නිලධාරීන්ට සීමිත තරග විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ හැකියාවක් නොමැත.

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය - 2016.07.29

සටහන - ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

(අ) ලිඛිත විභාගයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් සහිත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කෙරේ. ලිඛිත විභාගයෙන් සෑම විෂයයක් සඳහාම සමත් වීමට අවශ්‍ය 40% ක් වූ අවම ලකුණු සංඛ්‍යාව හා ඊට ඉහළ ලකුණු ලැබූවන් අතුරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු සංඛ්‍යාව ව්‍යුහගත හා ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලයට ලබා දෙනු නොලැබේ. ව්‍යුහගත හා ප්‍රායෝගික සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමය මෙම නිවේදනයේ අංක 09 යටතේ දක්වා ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ලිඛිත පරීක්ෂණය හා ව්‍යුහගත පරීක්ෂණයේ දේශන පැවැත්වීමේ ප්‍රායෝගික කුසලතාව යන දෙකෙහිම අවම සමත් ලකුණු ලැබූ අයදුම්කරුවන් අතුරින් මුළු ලකුණු සංඛ්‍යාව පදනම්ව ඉහළම ලකුණු ලැබූ අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සේවයට බඳවා ගනු ලැබේ. සමාන ලකුණු ලබා ඇති අපේක්ෂකයින් එක් අයෙකුට වඩා සිටිනම් ඒ පිළිබඳ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය සහ පත් කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත. ලිඛිත විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන්ම බඳවා ගනු ලැබේ. සෑම අයදුම්කරුවෙකුම අයදුම්කරන විෂයයේ භාෂා මාධ්‍යයෙන් ලිඛිත විභාගයට පෙනී සිට ඉන් සමත් විය යුතු අතර ප්‍රායෝගික පරීක්ෂණය ද එම භාෂා මාධ්‍යයෙන්ම සිදු කළ යුතුවේ.

(ආ) විවෘත තරග විභාගය මගින් සම්පූර්ණ කරනු ලබන පුරප්පාඩු සංඛ්‍යාවන් පහත දක්වා ඇත. බඳවා ගනු ලබන අයදුම්කරුවන් ලකුණු අනුපිළිවෙල පදනම් කරගෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථානවල පුරප්පාඩු සම්පූර්ණ කරනු ලබයි. එක් අයදුම්කරුවෙකුට එකම භාෂා මාධ්‍යයේ පහත පුරප්පාඩු දක්වා ඇති විෂයයන් 03ක් සඳහා ඉල්ලුම් කළ හැකිය. එක් අපේක්ෂකයෙකු විෂයයන් කිහිපයකට සුදුසුකම් ලැබුවහොත් ඔහු තම අයදුම්පතේ විෂයයන් ඉල්ලුම්කර ඇති අනුපිළිවෙල අනුව බඳවා ගන්නා විෂයය තීරණය කරනු ලැබේ.

විෂයය	*මාධ්‍යය*	*පුරප්පාඩු සංඛ්‍යාව*
වෘත්තීය විෂයය	සිංහල දෙමළ ඉංග්‍රීසි	61 39 8
සිංහල භාෂාව (මව් බස)	සිංහල	44
සිංහල භාෂාව (දෙවන බස)	සිංහල	6
දෙමළ භාෂාව (මව් බස)	දෙමළ	43
දෙමළ භාෂාව (දෙවන බස)	දෙමළ	6
ඉංග්‍රීසි	ඉංග්‍රීසි	53
සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය	සිංහල දෙමළ ඉංග්‍රීසි	11 8 3
නැටුම්	සිංහල දෙමළ	5 1
නැටුම් (භරත)	දෙමළ	1

විෂයය	මාධ්‍යය	පුරප්පාඩු සංඛ්‍යාව
සංගීතය	සිංහල දෙමළ	4 2
සංගීතය (කර්ණාටක)	දෙමළ	2
බටහිර සංගීතය	ඉංග්‍රීසි	1
චිත්‍ර	සිංහල දෙමළ	8 3
නාට්‍ය හා රංග කලාව	සිංහල දෙමළ	5 2
තොරතුරු සන්නිවේදන තාක්ෂණය	ඉංග්‍රීසි	9
ප්‍රාථමික අධ්‍යාපනය - මව්බස	සිංහල දෙමළ	4 2
ප්‍රාථමික අධ්‍යාපන - සෞන්දර්ය අධ්‍යාපනය	සිංහල දෙමළ	2 2
ප්‍රාථමික අධ්‍යාපන - ශාරීරික අධ්‍යාපනය	සිංහල දෙමළ	3 2
ප්‍රාථමික අධ්‍යාපන - විශේෂ අධ්‍යාපනය	සිංහල	2
ප්‍රාථමික අධ්‍යාපන - නිර්මාණ කුසලතා	සිංහල	3
ප්‍රාථමික අධ්‍යාපන - ඉංග්‍රීසි	ඉංග්‍රීසි	3
ප්‍රාථමික අධ්‍යාපන - ප්‍රාථමික විද්‍යාව	සිංහල දෙමළ	1 1
ප්‍රාථමික අධ්‍යාපන - ප්‍රාථමික ගණිතය	සිංහල දෙමළ	5 2
බුද්ධ ධර්මය	සිංහල	6
කතෝලික ධර්මය / ක්‍රිස්තු ධර්මය	සිංහල දෙමළ	2 2
හින්දු ධර්මය	දෙමළ	2
ඉස්ලාම් ධර්මය	දෙමළ	1
ගණිතය	සිංහල දෙමළ ඉංග්‍රීසි	5 3 2
ජීව විද්‍යාව	සිංහල දෙමළ ඉංග්‍රීසි	2 2 1
රසායන විද්‍යාව	සිංහල දෙමළ ඉංග්‍රීසි	3 1 2
භෞතික විද්‍යාව	සිංහල දෙමළ ඉංග්‍රීසි	3 1 2
පුරවැසි අධ්‍යාපන	සිංහල දෙමළ	2 1
පුස්තකාල හා තොරතුරු අධ්‍යාපනය	ඉංග්‍රීසි	1
කෘෂි විද්‍යාව	සිංහල	2
විශේෂ අධ්‍යාපන	සිංහල දෙමළ	1 1
ගෘහ ආර්ථික විද්‍යාව	සිංහල දෙමළ	1 2
ව්‍යවසායකත්ව අධ්‍යයනය	සිංහල	1

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

I. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1925/37 සහ 2015.07.28 වැනි දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද හා ඉන් පසුව කරන ලද සංශෝධන අනුව ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසි වලටද එම ව්‍යවස්ථා සංග්‍රහයට මින් මතු කෙරෙන සංශෝධනවලටද රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසි වලටද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයන් සේවයේ III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් තුන් අවුරුදු පරිවාස කාල සීමාවකට යටත් වේ.

III. ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියට පත්වී වසර 03 ක් ඉකුත් වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

IV. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශාංගික වන චක්‍රලේඛ අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාල ප්‍රවීණතා මට්ටම පත්වීමේ දින සිට වසර පහ (05)ක් ඇතුළත ලබා ගත යුතුවේ. රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් වසර තුන (03) ක් තුළදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, සේවයට බඳවා ගනු ලැබූ නිලධාරියෙකු බඳවා ගැනීමේ දින සිට වසර තුන (03) ක් ඇතුළත සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. නිලධාරියෙකු අ.පො.ස (සා.පෙ) විභාගයේදී ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන

සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයකින් සමත්ව ඇත්නම් සන්ධාන භාෂා පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. සෙසු නිලධාරීන් සේවා ව්‍යවස්ථාවේ උපලේඛන "VIII" සඳහන් පරීක්ෂණය සමත් විය යුතු ය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බඳවා ගත් නිලධාරියෙකු මෙම අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ.

V. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ සහ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදුකර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

VI. නේවාසික පහසුකම් සලසා ඇති විට අධ්‍යාපන විද්‍යාපීඨ සීමාව තුළ පදිංචි විය යුතු ය. නේවාසික පහසුකම් නොමැති විටදී සීමිත දුර ප්‍රමාණයක් තුළ පදිංචි වීමට අවසර දෙනු ලැබේ. එහෙත් විද්‍යාපීඨ සීමාව තුළ නිවාස පහසුකම් සැලසූ විටක එහි පදිංචි විය යුතු ය.

03. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 දරණ වැටුප් චක්‍රලේඛයට අනුව S:- 1-2006 හි රු. 22,935 -10x645-8x790-17x1050- රු. 53,555/= ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

04. *අධ්‍යාපන සුදුසුකම් :*

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් අදාළ විෂයය ක්ෂේත්‍රයේ දෙවන පෙළ (ඉහළ) පන්ති සාමාර්ථයක් සහිත උපාධියක් හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් ලබා තිබීම

හෝ

අදාළ විෂයය ක්ෂේත්‍රයේ අධ්‍යාපනවේදී දෙවන පෙළ (ඉහළ) පන්ති සාමාර්ථයක් සහිත උපාධිය ලබා තිබීම.

05. *වයස් සීමාව :*

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා 30 ට නොවැඩි විය යුතු ය.

06. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමානවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

07. *වෙනත් සුදුසුකම් :*

I. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

II. විවෘත තරඟ විභාගය සඳහා වාර තුන (03) කට වඩා පෙනී සිටීමට කිසිඳු තැනැත්තෙකුට අවසර නොමැත.

III. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගයට පෙනී සිටිමී සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනයට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

08. *අයදුම් කිරීමේ ක්‍රමය:*

සේවයට බඳවා ගැනීම සඳහා පහත දක්වා ඇති විෂයයන් 36 ක් සඳහා අයදුම්පත් භාර ගනු ලැබේ. එක් අපේක්ෂකයෙකුට විෂයයන් 3 ක් සඳහා ඉල්ලුම්කළ හැකි අතර තමා අයදුම්කරන විෂයයන් සහ ඊට අදාළ විෂය අංක අයදුම්පතේ නියමිත ස්ථානයේ සඳහන් කළ යුතු ය.

විෂයය ක්ෂෙත්‍රය	*විෂය අංකය*
වෘත්තීය විෂයය	01
සිංහල භාෂාව (මව්බස)	02
සිංහල භාෂාව (දෙවන බස)	03
දෙමළ භාෂාව (මව් බස)	04
දෙමළ භාෂාව (දෙවන බස)	05
ඉංග්‍රීසි	06
සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය	07
නැටුම්	08
නැටුම් (භරත)	09
සංගීතය	10
සංගීතය (කර්ණාටක)	11
බටහිර සංගීතය	12
චිත්‍ර	13
නාට්‍ය හා රංග කලාව	14
තොරතුරු සන්නිවේදන තාක්ෂණය	15
ප්‍රාථමික අධ්‍යාපනය - මව්බස	161
ප්‍රාථමික අධ්‍යාපන - සෞන්දර්ය අධ්‍යාපනය	162
ප්‍රාථමික අධ්‍යාපන - ශාරීරික අධ්‍යාපනය	163
ප්‍රාථමික අධ්‍යාපන - විශේෂ අධ්‍යාපනය	164
ප්‍රාථමික අධ්‍යාපන - නිර්මාණ කුසලතා	165
ප්‍රාථමික අධ්‍යාපන - ඉංග්‍රීසි	166
ප්‍රාථමික අධ්‍යාපන - ප්‍රාථමික විද්‍යාව	167
ප්‍රාථමික අධ්‍යාපන - ප්‍රාථමික ගණිතය	168
බුද්ධ ධර්මය	17
කතෝලික ධර්මය / ක්‍රිස්තු ධර්මය	18
හින්දු ධර්මය	19
ඉස්ලාම් ධර්මය	20
ගණිතය	21
ජීව විද්‍යාව	22
රසායන විද්‍යාව	23
භෞතික විද්‍යාව	24
පුරවැසි අධ්‍යාපනය	30
පුස්තකාල හා තොරතුරු අධ්‍යයනය	33
කෘෂි විද්‍යාව	34
විශේෂ අධ්‍යාපනය	35
ගෘහ ආර්ථික විද්‍යාව	36

සැ.යු.- අයදුම්කරන විෂය ධාරාව ප්‍රධාන විෂයයන්ගෙන් එකක් ලෙස උපාධියට හදාරා තිබීම අත්‍යාවශ්‍ය වන අතර උපාධිය සඳහා හදාරන මුළු විෂයය ඒකකය (සම්භාර) සංඛ්‍යාවෙන් තුනෙන් එකක්වත් (1/3) අයදුම් කරන විෂයයට අදාළ වන විෂයයක් විය යුතු ය.

09. *බඳවා ගැනීම :*

9.1 ලිඛිත විභාගය

9.1.1 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

9.1.2 විෂය නිර්දේශය : විෂයයන් තුනක් යටතේ මෙම විභාගය පවත්වනු ලැබේ. ව්‍යුහගත හා ප්‍රායෝගික සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබනුයේ සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම අවම වශයෙන් 40% ක් හා ඊට ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණි.

(i) විෂය අංක 01 : සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාව - ලකුණු 100යි - කාලය පැය 2යි.

ජාතික, කලාපීය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ මෙන්ම අප සමාජය තුළ පවතින සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධව අපේක්ෂකයා සතු දැනුවත්භාවය සහ අවබෝධය හා පදගත, සංඛ්‍යාත්මක සහ රූපකාර සන්දර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ නිගමනයන් සහ ප්‍රතිචාර පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුවන්ගේ අවබෝධ කරගැනීමේ ශක්තිය හා බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

(ii) විෂය අංක 02 : අවබෝධය හා සිද්ධි අධ්‍යයනය - ලකුණු 100යි - කාලය පැය 2යි.

දෙන ලද මාතෘකාවක්/තේමාවක් ඔස්සේ අදහස් සහ තොරතුරු ඉදිරිපත් කිරීම, ගොනු කිරීම සහ විකාශනය කිරීම සම්බන්ධයෙන් අපෙක්ෂකයා දක්වන තර්කන සහ පරිකල්පන ශක්තිය මැන බැලීමට සහ තරමක් සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරංශ වශයෙන් පැහැදිලිව සහ නිවැරදිව ප්‍රකාශ කිරීමට අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. ඊට අමතරව යම් ප්‍රස්තුත ගැටලුවක දී අපේක්ෂකයා එම ගැටලුව නිරාකරණය කිරීමට යොදා ගන්නා ක්‍රමවේද පරීක්ෂා කෙරේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

(iii) විෂය අංක 03 : අධ්‍යාපන මූලධර්ම - ලකුණු 100යි - කාලය පැය 1යි.

අධ්‍යාපන දර්ශනය , අධ්‍යාපන සමාජ විද්‍යාව, ගුරු භූමිකාව, අධ්‍යාපන ප්‍රතිපත්ති සහ නූතන ගැටලු, අධ්‍යාපන සැලසුම්කරණය සහ කළමනාකරණය, අධ්‍යාපන ඇගයීම,ඉගෙනුම් ඉගැන්වීම් උපාය මාර්ග, අධ්‍යාපන තාක්ෂණය සහ අධ්‍යාපන පර්යේෂණයන ක්ෂේත්‍රවලට අද ාළව අයදුම්කරුගේ අවබෝධය මෙයින් පරීක්ෂා කරනු ලැබේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

9.2 *ව්‍යුහගත හා ප්‍රායෝගික සම්මුඛ පරීක්ෂණය :*

ලිඛිත විභාගයෙන් එක් එක් විෂයය සඳහා 40% බැගින් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සඳහා පහත සඳහන් නිර්ණායක යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පහත සඳහන් පරිදි ව්‍යුහගත හා ප්‍රායෝගික පරීක්ෂණය පවත්වනු ලැබේ. (ලකුණු ලබා දීමේ පටිපාටිය උපලේඛනයෙහි ඇතුළත්ය.) සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව ඉහත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් නොමැති වුවහොත් එවැනි අවස්ථාවන්හිදී ව්‍යුහගත සම්මුණ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

I කොටස : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

ලකුණු ලබා දෙන නිර්ණායක	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු*
I කොටස		
01. අතිරේක අධ්‍යාපන සුදුසුකම්	15	අදාළ නොවේ
02. ගුරු වෘත්තියේ ලබා ඇති පළපුරුද්ද	15	
03. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය	10	
04. තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතාවය	10	

සටහන - මෙම නිවේදනයේ සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සපුරාලන්නේ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් සහතික මත නම් එම (විශ්වවිද්‍යාලයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පිළිගත් ආයතනයක් බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමෙන් ලබා ගත් තහවුරු කිරීමේ සහතිකයක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

II කොටස : ප්‍රායෝගික පරීක්ෂණය :

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ	*උපරිම ලකුණු ප්‍රමාණය*	*තෝරා ගැනීමට සලකා බලන අවම ලකුණු ප්‍රමාණය*
1. දේශන සටහන් පිළියෙල කිරීම	25	20
2. ඉදිරිපත් කිරීම	25	
2.1 පිවිසුම	04	
2.2 දේශන සැලැස්ම කරුණු සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම	04	
2.3 ඉදිරිපත් කිරීමේ විලාශය	08	
2.4 විෂයය අන්තර්ගතය	05	
2.5 කාල කළමනාකරණය	04	

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද බව සනාථ වූ අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි. ඉහත සඳහන් පරිදි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ අයදුම්කරුවන් අතුරින් කිසියම් සංඛ්‍යාවක් ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් නොලැබුව ද, එසේ සුදුසුකම් නොලැබූවන් වෙනුවට වෙනත් අයදුම්කරුවන් නැවත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

10. විභාග කොන්දේසි:

(i) විභාගය සිංහල, දෙමළ ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් තමන් ඉල්ලුම්කරන විෂයයේ භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පත්‍රයෙහි දැක්වෙන භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(ii) විභාග ගාස්තුව රු. 1,000/- කි. විභාග ගාස්තුව, විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදු පතෙහි දාරයක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායාපිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

(iv) මෙම විභාගය කොළඹ දී පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

(v) අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සටහන - ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භවන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.
අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(vi) ඉල්ලුම්පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්ත භාවිතා කරමින් සකස් කළ යුතු අතර, 01 සිට 04 තෙක් ශීර්ෂ පළමුවැනි පිටුවට ද, 05 සිට ඉදිරියට ශීර්ෂ දෙවැනි, තුන්වැනි හා හතරවැනි පිටුවලට ද, වන ලෙස සකස් කළ යුතු ය. අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පතය අසම්පූර්ණ ඉල්ලුම්පත්‍රත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදළ ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත් එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේපවන බවත් වැඩි දුරටත් දන්වමි.

(vii) ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයැදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, ඉල්ලුම් කරන විෂයය හා සංකේත අංකය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද අදාළ නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පල කරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ලඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(viii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

(ix) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

(x) අපේක්ෂකයාගේ අනන්‍යතාවය - විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයකුම විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. පහත සඳහන් ලේඛන වලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත,

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,

සැ.යු. - *(අ)* අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ පිටපතක් නොඇමිණිය යුතු ය;

(ආ) ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

(xi) අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අවස්ථාවේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. ඉදිරිපත් කර ඇති යම් කරුණක් සාවද්‍ය බව තනතුරට තෝරා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් හෝ යම් වැදග් කරුණක් ඕනෑකමින්ම යටපත් කර ඇත්නම් හෝ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

(xii) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවෙක් තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ. ආයතනයකින් විභාගයට පෙනී සිටින අයදුම්කරුවෙක් ඔහුගේ අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා සහතික කරගත යුතුය. එසේ නොවන අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසැල් ප්‍රධානියෙක්/විශ්‍රාමික ප්‍රධානියෙක්, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරියෙක්, සාමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රු. 240,360 හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙක් හෝ ලවා සහතික කරවා ගත යුතුය.

(xiii) *ප්‍රතිඵල නිකුත් කිරීම :*

ලිඛිත පරීක්ෂණයෙහි සුදුසුකම් ලැබූ අයගේ ලේඛනය *ගැසට්* නිවේදනයේ 9.1.2 ඡේදය අනුව ලේකම්, රාජ්‍ය සේවා කොමිෂම වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.exam.results.gov.lk වෙබ් අඩවියේ පලකිරීම සිදු කරනු ඇත.

(xiv) මෙම පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩබ්ලිව්. එම්. බන්දුසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2016 ජූනි මස 10 වන දින.

උපලේඛනය

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට විවෘත බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ලකුණු පරිපාටිය (දෙවන බස සිංහල සහ දෙවන බස දෙමළ හැර අනෙකුත් විෂයයන් සඳහා)

I කොටස - උපරිම ලකුණු 50

සැ.යු = *ගැසට්* නිවේදනයේ 04 ඡේදයෙහි සඳහන් සුදුසුකම් වලට අමතරව ලබා ඇති සහතික සඳහා උපරිම ලකුණු සීමාවට යටත්ව ලකුණු ලබා දෙනු ලැබේ.

01.අතිරේක අධ්‍යාපන සුදුසුකම් :	උපරිම ලකුණු 15
1.1 පශ්චාත් උපාධිය හෝ ඊට ඉහල (අධ්‍යාපන හෝ අදාල විෂයය පිළිබඳ)	10
1.2 පශ්චාත් උපාධි ඩිප්ලෝමා	05
02.ගුරු වෘත්තියේ ලබා ඇති පළපුරුද්ද :	උපරිම ලකුණු 15
ගුරු වෘත්තියේ සක්‍රීය හා සතුටුදායක සෑම වසරක් සඳහාම ලකුණු 03 බැගින් උපරිම වසර 05ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.	
03. ඉංග්‍රීසි භාෂා නිපුණතාවය :	උපරිම ලකුණු 10
3.1 උපාධියට ඉංග්‍රීසි විෂයයක් ලෙස හදාරා තිබීම	10
3.2 උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම	08
3.3 අ.පො.ස (උ.පෙළ ඉංග්‍රීසි විෂයයක් ලෙස සමත්වීම	06
3.4 අ.පො.ස (උ.පෙළ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම	04
3.5 විශ්ව විද්‍යාලයක හෝ පිළිගත් ආයතනයක ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම (වසරක් හෝ ඊට වැඩි)	03
3.6 පිළිගත් විශ්ව විද්‍යාලයක සහතික පත්‍ර පාඨමාලාව	02
3.7 අ.පො.ස (සා.පෙළ) ඉංග්‍රීසි විෂයය සඳහා විශිෂ්ඨ /අධි සම්මාන / සම්මාන සාමාර්ථය	01
04. තොරතුරු තාක්ෂණ දැනුම :	උපරිම ලකුණු 10
4.1 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධිය	
4.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උපාධිය	08
4.3 උපාධිය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයක් ලෙස හදාරා තිබීම	06

4.4 තොරතුරු හා සන්නිවේදන
තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
(අවුරුදු 1 ට හෝ ඊට වැඩි) 04
4.5 තොරතුරු හා සන්නිවේදන
තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
(මාස 06 වැඩි) 02
4.6 තොරතුරු හා සන්නිවේදන
තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
(මාස 06 දක්වා) 01
මුළු ලකුණු 50

II කොටස = ප්‍රයෝගික පරීක්ෂණය = උපරිම ලකුණු 50

01. පරීක්ෂණ මණ්ඩලය මගින් විෂයට
අදාළව ලබාදෙන මාතෘකාවක්
යටතේ දේශනයක් පැවැත්වීම
සඳහා වූ දේශන සටහන් පත්‍රයක්
පිළියෙළ කිරීම 25

02. එම සටහන් පත්‍රයේ සඳහන් කරුණු
වලට අදාළව දේශනයක් පරීක්ෂණ
මණ්ඩලය ඉදිරියේ පැවැත්වීම 25
මුළු ලකුණු 50

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට විවෘත බඳවා ගැනීම් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ලකුණු පරිපාටිය
(දෙවන බස සිංහල සහ දෙවන බස දෙමළ විෂයයන් සඳහා)

I කොටස - **උපරිම ලකුණු 50**

සැ.යු =ගැසට් නිවේදනයේ 04 ඡේදයෙහි සඳහන් සුදුසුකම් වලට අමතරව ලබා ඇති සහතික සඳහා උපරිම ලකුණු සීමාවට යටත්ව ලකුණු ලබා දෙනු ලැබේ.

01.අතිරේක අධ්‍යාපන සුදුසුකම් උපරිම ලකුණු 15
1.1 පශ්චාත් උපාධිය හෝ ඊට ඉහල 10
(අධ්‍යාපන හෝ අදාල විෂයය පිළිබඳ)
1.2 පශ්චාත් උපාධි ඩිප්ලෝමා 03
1.3 රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ
සිංහල /දෙමළ II මට්ටම 02
සමත් හෝ අ.පො.ස (සා.පෙළ) දෙවන බස සිංහල/දෙමළ විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ වාචික පරීක්ෂණය සමත්වීම.
(මේ යටතේ දෙවන බස සිංහල විෂයය සඳහා දෙමළ භාෂා සහතිකද දෙවන බස දෙමළ විෂයය සඳහා සිංහල භාෂා සහතිකද සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.)

02. ගුරු වෘත්තියේ ලබා ඇති පළපුරුද්ද උපරිම ලකුණු 15
ගුරු වෘත්තියේ සක්‍රීය හා සතුටුදායක
සෑම වසරක් සඳහාම ලකුණු 03
බැගින් උපරිම වසර 05ක් සඳහා
ලකුණු ලබා දෙනු ලැබේ.

03.ඉංග්‍රීසි භාෂා නිපුණතාවය උපරිම ලකුණු 10

3.1 උපාධියට ඉංග්‍රීසි විෂයයක්
ලෙස හදාරා තිබීම 10
3.2 උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම 08
3.3 අ.පො.ස (උ.පෙළ) ඉංග්‍රීසි
විෂයයක් ලෙස සමත්වීම 06
3.4 අ.පො.ස (උ.පෙළ) ඉංග්‍රීසි
මාධ්‍යයෙන් හදාරා තිබීම 04
3.5 විශ්ව විද්‍යාලයක හෝ පිළිගත්
ආයතනයක ඩිප්ලෝමා පාඨමාලාවක්
හදාරා තිබීම (වසරක් හෝ ඊට වැඩි) 03
3.6 පිළිගත් විශ්ව විද්‍යාලයක
සහතික පත්‍ර පාඨමාලාව 02
3.7 අ.පො.ස (සා.පෙළ) ඉංග්‍රීසි විෂයය
සඳහා විශිෂ්ඨ /අධි සම්මාන /
සම්මාන සාමාර්ථය 01

04.තොරතුරු තාක්ෂණ දැනුම උපරිම ලකුණු 10

4.1 තොරතුරු හා සන්නිවේදන
තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධිය 10
4.2 තොරතුරු හා සන්නිවේදන
තාක්ෂණය පිළිබඳ උපාධිය 08
4.3 උපාධිය සඳහා තොරතුරු හා
සන්නිවේදන තාක්ෂණය විෂයයක්
ලෙස හදාරා තිබීම 06
4.4 තොරතුරු හා සන්නිවේදන
තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
(අවුරුදු 1 ට හෝ ඊට වැඩි) 04
4.5 තොරතුරු හා සන්නිවේදන
තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
(මාස 06 වැඩි) 02
4.6 තොරතුරු හා සන්නිවේදන
තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
(මාස 06 දක්වා) 01
මුළු ලකුණු 50

II කොටස = ප්‍රයෝගික පරීක්ෂණය = උපරිම ලකුණු 50

01. පරීක්ෂණ මණ්ඩලය මගින් විෂයට
අදාළව ලබාදෙන මාතෘකාවක්
යටතේ දේශනයක් පැවැත්වීම
සඳහා වූ දේශන සටහන්
පත්‍රයක් පිළියෙළ කිරීම 25

02. එම සටහන් පත්‍රයේ සඳහන් කරුණු
වලට අදාළව දේශනයක් පරීක්ෂණ
මණ්ඩලය ඉදිරියේ පැවැත්වීම 25
මුළු ලකුණු 50

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය- 2015 (2016)
Open Competitive Examination for Recruitment to Grade III of the Sri Lanka Teacher Educators Service- 2015 (2016)

විභාගයට පෙනී සිටින මාධ්‍යය

සිංහල	-	2	
දෙමළ	-	3	
ඉංග්‍රීසි	-	4	(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ඉල්ලුම කරන විෂයය හා විෂය අංකය පහත දැක්වෙන වගුවේ සඳහන් කරන්න.(ගැසට් නිවේදනයෙහි අංක 08 ඡේදයට අදාළව)

අනු අංකය	විෂයය	විෂයය අංකය
1		
2		
3		

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————————————.
(උදා- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDENA)
1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම -
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————————————.
(උදා- GUNAWARDENA,H.M.S.K.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) :————————————.

02. 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————————————.
2.2 පෞද්ගලික දුරකථන අංකය (තිබේ නම්):————————————.
2.3 රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):————————————.
2.4 රාජකාරි දුරකථන අංකය (තිබේ නම්) :————————————.
2.5 ස්ථිර ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්) :————————————.
2.6 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————————————.

03. ස්ත්‍රී / පුරුෂ භාවය

ස්ත්‍රී	-	0	
පුරුෂ	-	1	(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. 5.1 ජනවර්ගය
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල	-	1	ඉන්දියානු දෙමළ	-	3
දෙමළ	-	2	මුස්ලිම්	-	4
			වෙනත්	-	5

5.2 විවාහක/ අවිවාහක බව : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

අවිවාහක	-	1
විවාහක	-	2

5.3 උපන්දිනය: වර්ෂය: මාසය: දිනය:

5.4 2016.07.29 දිනට වයස : අවුරුදු: මාස: දින:

06. *අධ්‍යාපන සුදුසුකම් :*
(අ) (i) උපාධිය හෝ වෙනත් සුදුසුකම් ලබාගත් දිනය :————————————.
(වලංගු දිනය)
(ii) උපාධිය /වෙනත් සුදුසුකම (නම):————————————.
(iii) හදාරන ලද ප්‍රධාන විෂයයන් :————————————.

(iv) විශ්ව විද්‍යාලය / ආයතනය :————————————.
(v) බාහිර/අභ්‍යන්තරඃ————————————.

(ආ)(i) පශ්චාත් අධ්‍යාපන උපාධි ඩිප්ලෝමාව සමත් දිනය :————————————.
(ii) හදාරන ලද විෂයයන් :————————————.
(iii) විශ්ව විද්‍යාලය /ආයතනය :————————————.

07. (i) ගුරුවරයකු වශයෙන් මුලින්ම රජයේ සේවයට පත් වූ දිනය :————————————.
(ii) එම ගුරුපත්වීම ලබා දී ඇති විෂයයඃ————————————.
(iii) දැනට සේවය කරන අධ්‍යාපන කලාපයඃ————————————.
(iv) 2016.07.29 දිනට සේවා කාලය අවු :————. මාස :————. දින :————.

08. (i) ගුරු පුහුණුව ලත් වර්ෂය :————————————.
(ii) ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ / ගුරු විදුහලේ නම :————————————.
(iii) පුහුණු සහතිකය වලංගු වන දිනය :————————————.
(iv) පුහුණුව ලත් විෂයය ක්ෂේත්‍රය :————————————.
(v) පුහුණුවට අදාළ විෂයය සඳහා ගුරුපත්වීම ලද දිනය :————————————.
(vi) එම පත්වීම් දින සිට 2016.07.29 දිනට සේවා කාලය :————————————.
අවු :————. මාස :————. දින :————.

09. ඔබ දැනට දරන තනතුරේ සේවය ස්ථිර කරනු ලැබ ඇත්තේද :————————————.
10. ඔබ රජයේ සේවයට ඇතුලත් වීම සඳහා සුදුසුකම් ලැබූ විභාගය සමත් වූ භාෂාව සඳහන් කරන්න :————————————.
11. විභාග ගාස්තු :

විභාග ගාස්තු ගෙවා ලබා ගත් ලදුපත මෙයි අලවන්න. (ලදුපතේ ඡායා පිටපතක් ලග තබා ගන්න.)

12. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම් හා විශ්වාසය අනුව සත්‍ය බවත් , විභාග ගාස්තු ගෙවන ලද අංක——— හා ———— දින දරන ලදුපත මීට අමුණා ඇති බවත් ප්‍රකාශ කරමි.තවද විභාග නීතිරීති වලට අනුව ක්‍රියාකිරීමටත් ,විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට අනුව ක්‍රියාකිරීමටත්. මෙම විභාග පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවතිද්දී හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හෝ ගනු ලබන යම් තීරණයකටත් මම එකඟ වෙමි.මා මෙම තනතුරට තෝරා ගැනීමෙන් පසුව වුවද නුසුදුසු බව පෙනී ගියහොත් මා සේවයෙන් පහ කිරීමටත් යටත් වන බව දනිමි.

————————. ————————.
දිනය අයදුම්කරුගේ අත්සන.

අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම

මෙහි අත්සන් කරන ලද ..... හි පදිංචි ..... හිමි/මයා /මිය/ මෙය මම පුද්ගලිකව හඳුනන බවත් ඔහු/ ඇය ගේ අත්සන මා ඉදිරිපිටදී තැබූ බවත් සහතික කරමි.

————————.
සහතික කරන්නාගේ අත්සන
නිලමුද්‍රාව

නම :————————————.
තනතුර :————————————.
ලිපිනය :————————————.
දිනය :————————————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

———————— ගේ ඉල්ලුම්පත ඉදිරිපත් කරමි. ඔහු /ඇය මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් ———— වශයෙන් සේවය කරන බවත් , මේ තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය සේවයෙන් නිදහස් කළහැකි / නොහැකි බවත් දන්වමි.

————————.
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය :————————————.
දෙපාර්තමේන්තුව :————————————.

07-210/1

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

	රු.	ශ.
අඟලකට හෝ ඉන් අඩුව	...137	0
වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට	137	0
තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට	... 1,300	0
තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට	... 2,600	0

(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. ගැසට් පත්‍රය නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

		වාර්ෂික දායක මුදල රු. ශ.	තැපැල් ගාස්තුව රු. ශ.
I වැනි කොටස :			
I	වැනි ඡේදය	4,160 00	9,340 00
II	වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය)	580 00	950 00
III	වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය)	405 00	750 00
I	වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව)	890 00	2,500 00
II	වැනි කොටස (අධිකරණ)	860 00	450 00
III	වැනි කොටස (ඉඩම්)	260 00	275 00
IV	වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ...	2,080 00	4,360 00
V	වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය)	1,300 00	3,640 00
VI	වැනි කොටස (ජූරිසහිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ...	780 00	1,250 00
අති විශෙෂ ගැසට් පත්‍රය...		5,145 00	5,520 00

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)

* තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

	පිටපතක මිල රු. ශ.	තැපැල් ගාස්තුව රු. ශ.
I වැනි කොටස :		
I වැනි ඡේදය	40 00	60 00
II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය)	25 00	60 00
III වැනි ඡේදය	15 00	60 00
I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව)	80 00	120 00
II වැනි කොටස	12 00	60 00
III වැනි කොටස	12 00	60 00
IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්)	23 00	60 00
V වැනි කොටස	123 00	60 00
VI වැනි කොටස	87 00	60 00

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.

සැළකිය යුතුයි. - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

උපලේඛනය

මාසය	*පළ කිරීමේ දිනය*		*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව*			
	2016					
ජූලි	2016.07.01	සිකුරාදා	2016.06.17	සිකුරාදා	දහවල්	12.00
	2016.07.08	සිකුරාදා	2016.06.24	සිකුරාදා	දහවල්	12.00
	2016.07.15	සිකුරාදා	2016.07.01	සිකුරාදා	දහවල්	12.00
	2016.07.22	සිකුරාදා	2016.07.08	සිකුරාදා	දහවල්	12.00
	2016.07.29	සිකුරාදා	2016.07.15	සිකුරාදා	දහවල්	12.00
අගෝස්තු	2016.08.05	සිකුරාදා	2016.07.22	සිකුරාදා	දහවල්	12.00
	2016.08.12	සිකුරාදා	2016.07.29	සිකුරාදා	දහවල්	12.00
	2016.08.19	සිකුරාදා	2016.08.05	සිකුරාදා	දහවල්	12.00
	2016.08.26	සිකුරාදා	2016.08.12	සිකුරාදා	දහවල්	12.00
සැප්තැම්බර්	2016.09.02	සිකුරාදා	2016.08.19	සිකුරාදා	දහවල්	12.00
	2016.09.09	සිකුරාදා	2016.08.26	සිකුරාදා	දහවල්	12.00
	2016.09.15	බ්‍රහස්පතින්දු	2016.09.02	සිකුරාදා	දහවල්	12.00
	2016.09.23	සිකුරාදා	2016.09.09	සිකුරාදා	දහවල්	12.00
	2016.09.30	සිකුරාදා	2016.09.15	බ්‍රහස්පතින්දු	දහවල්	12.00

බී. කේ. එස්. රවීන්ද්‍ර,
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2016 ජූනි මස 21 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.